# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2009 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්

පිටුව


1. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත ........................................................ 1

2. 2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත........................................................ 7

3. 2009 අංක 14 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත........................ 9

4. 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත........................................ 9

5. 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත ........................................ 15

6. 2009 අංක 17 දරන හර බදු (සංශෝධන) පනත ........................................................ 16

7. 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත........................................................ 17

8. 2009 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත........................................ 19

9. 2009 අංක 32 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත .................................... 27

10. 2009 අංක 47 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත 28

11. 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ........................................................ 29

12. 2009 අංක 55 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත 39

# 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත

(සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 11 වන දින)

මේ පනත අදාළ වන සෑම තැනැත්තකුගේ ම බද්දට යටත් පිරිවැටුම මත ජාතිය ගොඩනැගීමේ බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පැනවීම සහ රැස්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස දත ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2009 පෙබරවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (1) මේ පනතේ විධිවිධාන පහත දැක්වෙන සෑම තැනැත්තකුට ම අදාළ වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(අ) මගියකුගේ පෞද්ගලික ගමන් මල්ලක අඩංගු බඩු නොවන ඕනෑම ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ["ගමන් මල්ලක අඩංගු බඩු" යන්නට (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 107අ වගන්තියේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය] ; හෝ

(ආ) යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරනු ලබන හෝ

(ඇ) ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක යෙදී සිටින.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකු ම මේ පනතේ මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

3. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව මේ පනත අදාළවන සෑම තැනැත්තකුගේම පහත දැක්වෙන ආකාරයට සියයට එකක් ලෙස ගණන් බලනු ලබන (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතිය ගොඩනැගීමේ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් අයකරනු ලැබිය යුතු ය.:-

(i) 2009 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට යම් ද්‍රව්‍යයක් ආනයනය කරනු ලබන 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එකී ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමෙන් පැනනගින ඒ තැනැත්තාගේ බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන් බද්ද අයකරනු ලැබිය යුතු ය; සහ

(ii) (මෙහි මින් මතු "අදාල කාර්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) 2009 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන සෑම කාර්තුවක් සඳහාම 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එකී අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන් බද්ද අයකරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ "බද්දට යටත් පිරිවැටුම" යන්නෙන් -

(i) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ද්‍රව්‍ය ආනයනය කිරීමෙන් උපචිත වන 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තියේ කාර්යය සඳහා නිශ්චිතව ගණනය කරන ලද එම ද්‍රව්‍යයේ වටිනාකම අදහස් වේ;

(ii) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සහ යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන විට, එකී තැනැත්තා විසින් නිෂ්පාදනය කරන ලද සෑම ද්‍රව්‍යයක්ම ශ්‍රී ලංකාව තුළ විකිණීමෙන් එකී කාර්තුව තුළ ලැබිය යුතු මුදල ලැබුනේ වුවද නොලැබුනේ වුව ද එසේ ලැබිය යුතු මුදල අදහස් වේ;

(iii) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එම ඡේදයේ සඳහන් යම් සේවාවක් ශ්‍රී ලංකාව තුළ සැපයීම මගින් ලැබිය යුතු මුදල ලැබුනේ වුව ද නොලැබුනේ වුව ද එසේ ලැබිය යුතු මුදල අදහස් වේ.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන (ii) වන හෝ (iii) වන ඡේදවල සඳහන් යම් තැනැත්තකුගේ බද්දට යටත් පිරිවැටුමට -

(i) එම කාර්තුවේ දී එකී තැනැත්තා විසින් දරන ලද යම් බොල් ණයක්;

(ii) එම අදාළ කාර්තුව තුළදී ගෙවන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ යම් එකතු කළ අගය මත බද්දක්;

(iii) එම කාර්තුවේ දී ගෙවන ලද 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වූ යම් නිෂ්පාදන බද්දක්,

ඇතුළත් නොවිය යුතු ය.

එසේ වුව ද, එම අදාළ කාර්තුව තුළදී ආපසු අයකරගන්නා ලද යම් බොල්ණය මුදලක් එම අදාළ කාර්තුවේ අදාළ පිරිවැටුමට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුගෙන් යම් අදාළ කාර්තුවක් සඳහා අයවිය යුතු බද්ද

(i) එම අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ බද්දට යටත්වන පිරිවැටුම රුපියල් හය ලක්ෂ පනස් දහස නොඉක්ම වන්නේ නම්, හෝ

(ii) ඒ තැනැත්තා ඒ අදාළ කාර්තුව සඳහා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ III ආ පරිච්ඡේදය යටතේ යම් විකල්ප එකතු කළ අගය මත බද්දක් ගෙවා ඇත්නම්,

අයකරනු නොලැබිය යුතු ය.

4. 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් තැනැත්තකු වන මේ පනත අදාළ වන සෑම තැනැත්තකු ම, එම අදාළ කාර්තුව සඳහා කිසිදු තක්සේරු කිරීමක් ඔහු පිළිබඳව සිදුකර නැති වුව ද එය නොතකා -

(i) එම කාර්තුවේ දෙවන මාසයේ විසිවන දින දී හෝ එදිනට පෙර, එම අදාළ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් තුනෙන් එකකට සමාන මුදලක්;

(ii) එම අදාළ කාර්තුවේ තුන්වන මාසයේ විසිවන දින දී හෝ එදිනට පෙර එම අදාළ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් තුනෙන් එකකට සමාන මුදලක්; සහ

(iii) එම අදාළ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ විසිවන දින දී හෝ එදිනට පෙර එම අදාළ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දේ ඉතිරි මුදලට සමාන මුදලක්,

තත්කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා යම් අදාළ කාර්තුවකට අදාළව "ගෙවිය යුතු බද්දෙන් තුනෙන් එකක්" යන යෙදුමෙන් එකී තැනැත්තා විසින් එම අදාළ කාර්තුව සඳහා බද්දට යටත් පිරිවැටුම වශයෙන් ඇස්තමේන්තු කරන ලද මුදල මත ගණනය කරන ලද බද්දෙන් තුනෙන් එකක් අදහස් වේ.

5. (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සෑම තැනැත්තකුගෙන්ම භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී, එකී තැනැත්තා විසින් එසේ ආනයනය කරන ලද සෑම ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් ම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, බද්ද රැස් කරනු ලැබිය යුතු අතර, එසේ රැස් කරන ලද මුදල නිශ්චිතව දක්වමින් ද්‍රව්‍ය ආනයන ඉන්වොයිස් පත්‍රය මත ඔහු විසින් පිටසනක් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් ආනයනය කරන ලද යම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රැස් කරන ලද යම් මුදලක්, එකී ද්‍රව්‍යය ආනයනය කිරීමෙන් පැන නගින ලද බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන් අයකළ යුතු බද්ද ලෙස සලකනු ලැබිය යුතු අතර එකී මුදල රැස් කර ගන්නා ලද දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත එකී මුදල ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ රැස් කළ යුතු යම් මුදලක් එම මුදල රැස් කිරීම සහ නැවත අයකිරීමේ කාර්යය සඳහා රේගු ආඥාපනත යටතේ අය කළ යුතු රේගු බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එකී මුදල රැස් කිරීම සහ අයකර ගැනීම සඳහා රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් ද්‍රව්‍යයක්"

(i) රේගු ආඥාපනත යටතේ රැස්කළ යුතු යම් බද්දක්, අයභාරයක් හෝ අයකිරීමක් ලබාගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්; හෝ

(ii) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එකී පනත යටතේ ලැබිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා; හෝ

(iii) කොමසාරිස් ජනරාල්වරයා විසින්,

විකුණා ඇති අවස්ථාවක, එකී ද්‍රව්‍යය මිළදීගත් තැනැත්තා 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

6. 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකු වන, මේ පනත අදාළ වන තැනැත්තකු

(i) 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව යම් අදාළ කාර්තුවක් සඳහා ඔහු විසින් ආනයනය කරන ලද යම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් බද්ද ගෙවා ඇති ලෙස සලකනු ලබන අවස්ථාවක්; හෝ

(ii) එම ඡේදයේ සඳහන් වෙනත් යම් තැනැත්තකුගෙන් ඔහු විසින් මිලදී ගන්නා ලද යම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් 4 වන වගන්තිය යටතේ බද්ද ගෙවා ඇති අවස්ථාවක්,

යන ඉහත කවර හෝ අවස්ථාවකදී, එකී ද්‍රව්‍යය ඔහුගේ නිෂ්පාදන ව්‍යාපාරයෙහි අනන්‍ය භාවිතය සඳහා වන යම් ද්‍රව්‍යයක් වන විට, එම අදාළ කාර්තුව සඳහා 4 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දට එරෙහිව එසේ ගෙවනු ලබන බද්ද බැර කිරීමට ඒ තැනැත්තාට හිමිකමක් ඇත්තේ ය;

එසේ වුව ද, යම් අදාළ කාර්තුවක් සඳහා වූ බැරකරන ලද මුදල එම කාර්තුව සඳහා එසේ ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය ඉක්මවා යන අවස්ථාවක දී, එම අතිරික්ත මුදල, එම අදාළ කාර්තුවට ඉක්බිතිව ම එළඹෙන අදාළ කාර්තුව සඳහා 4 වන වගන්තිය යටතේ කරන ලද යම් පෙර ගෙවුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

7. යම් අදාළ කාර්තුවක් සඳහා බද්දට යටත් පිරිවැටුම 3 වන වගන්තියේ (4) වන උප වගන්තියේ සඳහන් මුදල ඉක්මවා යන 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් තැනැත්තකු වන, මේ පනත අදාළ වන සෑම තැනැත්තකු විසින් ම එම අදාළ කාර්තුවේ අවසාන මාසයේ පහළොස්වන දිනයට පසු නොවන දිනයක දී, එම කාර්තුව සඳහා වූ අයකළ යුතු බද්ද පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. එම දැනුම්දීම මගින් නම, තැපැල් ලිපිනය, බදු ගෙවන්නාගේ හඳුනාගැනීමේ අංකයක් ඇතොත් එම අංකය හෝ ආදායම් බදු ලිපි ගොනු අංකය සහ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු අනාවරණය කරනු ලැබිය යුතු ය.

8. පහත දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව දේශීය ආදායම් පනතේ වාර්තා යනාදියට අදාළ XII වන පරිච්ඡේදයේ 106, 107, 108, සහ 112 වන වගන්තිවල විධිවිධාන ද තක්සේරු කිරීමට අදාළ XXII වන පරිච්ඡේදයේ විධිවිධාන ද, අභියාචනවලට අදාළ XXIII වන පරිච්ඡේදයේ විධිවිධාන ද, තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවය සහ වැරදි වාර්තා

සම්බන්ධයෙන් දණ්ඩනවලට අදාළ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන ද, පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල් වලට අදාළ XXV වන පරිච්ඡේදයේ විධිවිධාන ද, බදු අයකරගැනීමට අදාළ XXVI වන පරිච්ඡේදයේ විධිවිධානද, විවිධ කරුණුවලට අදාළ XXVII වන පරිච්ඡේදයේ විධිවිධාන ද වැරදි හා දණ්ඩනවලට අදාළ XXIX වන පරිච්ඡේදයේ විධිවිධාන ද, පරිපාලනයට අදාළ XXX වන පරිච්ඡේදයේ 209 වන වගන්තියේ විධිවිධාන සහ පොදු කාරණා වලට අදාළ XXXI වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ වාර්තා සැපයීම්, තක්සේරුකිරීම්, තක්සේරු කිරීම්වලට එරෙහි අභියාචන, තක්සේරුවල අවසානාත්මක භාවය, වැරදි සඳහා වූ දණ්ඩන, බදු ගෙවීම පැහැර හැරීම සහ ඊට එකතු කරන ලද මුදල්, බදු අයකර ගැනීම, විවිධ කරුණු, දණ්ඩන සහ වැරදි, පරිපාලනය සහ පොදු කාරණා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:-

(අ) දේශීය ආදායම් පනතේ එවැනි යම් විධිවිධානයක තක්සේරු වර්ෂයක් සඳහා කරනු ලබන සෑම සඳහනක්ම මේ පනතේ "අදාළ කාර්තුවට" කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) දේශීය ආදායම් පනතේ එවැනි යම් විධිවිධානයක තක්සේරු කළ හැකි ආදායමට හෝ බදු අයකළ හැකි ආදායමට කරනු ලබන සෑම සඳහනක්ම මේ පනතේ "බද්දට යටත් පිරිවැටුමට" කරනු ලබන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඇ) දේශීය අදායම් පනතේ එවැනි යම් විධිවිධානයක ආදයම් බද්දට කරනු ලබන සෑම සඳහනක්ම මේ පනතේ විධිවිධාන ප්‍රකාරව අයකරනු ලබන සහ පනවා ඇති බද්දට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

10. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"ද්‍රව්‍යය" යන්නට යම් භාණ්ඩ, රෙදි හෝ යම් කෘෂිකාර්මික හෝ ගෙවතු නිෂ්පාදන ඇතුළත් වන නමුත් මේ පනතේ උපලේඛනයේ 1 වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිදහස් කරන ලද යම් ද්‍රව්‍යයක් ඊට ඇතුළත් නොවේ;

"පුද්ගල මණ්ඩලය", "ව්‍යාපාරය", "කොමසාරිස් ජනරාල්වරයා" සහ "සමාගම" යන යෙදුම්වලට දේශීය ආදායම් පනතේ පිළිවෙළින් එම යෙදුම්වලට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"දේශීය ආදායම් පනත" යන්නෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අදහස් වේ;

"නිෂ්පාදනය" යන්නෙන් -

(i) යම් ද්‍රව්‍යයක් සෑදීමේ;

(ii) රසායනික ක්‍රමයක් මගින් හෝ අන්‍යාකාරයකට යම් භාණ්ඩයක් එකලස් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ;

(iii) යම් ද්‍රව්‍යයක් විකිණීම සඳහා වෙනස් කිරීමේ;

(iv) පාරිභෝගිකයකු වෙත අනන්‍ය ලෙස හෝ සෘජුවම විකිණීමේ කාර්ය සඳහා සිල්ලර වෙළෙඳ සැලක තබා ගැනීම හැර යම් ද්‍රව්‍යයක් විකිණීම සඳහා ඇසුරුම් කිරීමේ, බෝතල්වලට දැමීමේ, පෙට්ටිවලට දැමීමේ කැලිවලට කැපීමේ, පිරිසිදු කිරීමේ, පොලිෂ් කිරීමේ, දැවටීමේ, ලේබල් කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකට සූදානම් කිරීමේ,

යම් ක්‍රියාවලියක් අදහස් වේ.

"තැනැත්තා" යන්නට යම් සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් අදහස් වේ;

"කාර්තුව" යන්නෙන් යම් වර්ෂයක ජනවාරි, අප්‍රේල්, ජුලි හෝ ඔක්තෝබර් යන මාසවල පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාව අදහස් වේ;

එසේ වුව ද, 2009 පෙබරවාරි මාසයේ පළමුවන දිනයෙන් ආරම්භ වන ලෙස සලකනු ලබන කාර්තුව මාස දෙකකින් සමන්විත වන්නේ ය;

"සේවා" යන්නට මේ පනතේ උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිදහස් කරන ලද යම් සේවාවක් ඇතුළත් නොවේ;

**උපලේඛනය**

I වන කොටස

**නිදහස් කරන ලද ද්‍රව්‍ය**

(i) යම් ද්‍රව්‍යයක නිෂ්පාදකයා විසින් අපනයනය කරනු ලබන යම් ද්‍රව්‍යයක්;

(ii) අපනයනය කිරීම සඳහා යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ දී හෝ ඒ සඳහා අනන්‍ය ලෙස භාවිත කිරීමට යම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ තිරවුරු නොවන යම් ද්‍රව්‍යයක්;

(iii) අපනයනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ යම් බැංකුවක අපනයනකරු විසින් විවෘත කරන ලද ණයවර ලිපියක් හෝ එම ද්‍රව්‍යය ඇත්ත වශයෙන් ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ ද්‍රව්‍යයක් බවට වෙනත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීම මත කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, මේ පනත ආදළ වන යම් තැනැත්තකු විසින් යම් අපනයනකරුවකුට විකුණනු ලබන යම් ද්‍රව්‍යයක්;

(iv) යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබුවේ

  (i) යම් ප්‍රදර්ශනයක දී ප්‍රදර්ශනය කිරීම සඳහා බවට;

  (ii) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකාවේ දී තාවකාලිකව භාවිතා කිරීම සඳහා බවට;

  (iii) එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවේ දී අලුත්වැඩියා කිරීමේ කාර්ය සඳහා බවට; හෝ

  (iv) වෙනත් යම් සමාන කාර්යයක් සඳහා බවට සහ එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත ආපසු නැව්ගත කරනු ලබන බව,

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එසේ ආනයනය කරන ලද ද්‍රව්‍යයක්;

(v) යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට පෙර අලුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙනයනු ලැබූ බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් එම ද්‍රව්‍ය ආනයනය කිරීම;

(vi) ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කර ජාතික චිත්‍රපට සංස්ථාවේ අනුමතය ඇතිව තවදුරටත් සකස් කිරීම හෝ මුද්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙනයනු ලැබූ යම් සිනමාත්මක චිත්‍රපටයක් හෝ ටෙලි නාට්‍යයක්;

(vii) යම් ගුවන් සේවයකට හෝ නැව් සමාගමකට අයත් හෝ අධිකාරියට යටත් ජාත්‍යන්තර ගමනාගමනයේ යෙදෙන යම් ගුවන් යානයක හෝ නැවක නඩත්තුව සඳහා භාවිත කරනු ලැබීම සඳහා බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් යම් ගුවන් සේවයක් හෝ නැව් සමාගමක් විසින් ආනයනය කරනු ලබන අමතර කොටස්;

(viii) එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ එම සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍ය ආයතනයකට හෝ යම් විදේශීය රටක රාජ්‍ය දූත මණ්ඩලයකට හෝ එම දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ විදේශ දූත මණ්ඩල තත්වය ඇති බවට විදේශ අමාත්‍යවරයාගේ නිර්දේශයක් මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් තැනැත්තකුට විකුණනු ලබන යම් ද්‍රව්‍යයක්;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ අයකර ගනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යම් ද්‍රව්‍යයක් යටත් වන්නේ නම්, එම ද්‍රව්‍යය ආනයනය කිරීම ;

(x) පොහොර ;

(xi) ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන ;

(xii) එල්. පී. ගෑස් ;

(xiii) ඖෂධීය ද්‍රව්‍ය ; සහ

(xiv) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයකු වන නිෂ්පාදකයකු විසින්, කොළඹ තේ වෙන්දේසි පොලවල දී විකිණීම සඳහා, ලියාපදිංචි තැරැව්කරුවකුට සපයනු ලබන තේ.

## II වන කොටස

### නිදහස් කරන ලද සේවා

පහත දැක්වෙන සේවාः-

(i) බැංකු හෝ මූල්‍ය ව්‍යාපාර කටයුතු ;

(ii) විදුලි බලය සැපයීම ;

(iii) වෛද්‍ය සේවා ;

(iv) ජලය සැපයීම ;

(v) භාණ්ඩ හෝ මගී ප්‍රවාහනය ;

(v) භාණ්ඩ හෝ මගී ප්‍රවාහනය ;

(vi) චංචල දේපළ බදුදීම ;

(vii) ගොඩනැගිලි, පාරවල්, පාලම්, ජලසැපයුම, ජලය හෝ මල ප්‍රවාහන පද්ධති, වරාය, ගුවන්තොටුපල ඉදිකිරීම් හෝ විදුලි සංදේශ හෝ විදුලි බලය පිළිබඳ යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සම්බන්ධ ඉදිකිරීම් වනතාක් දුරට උප කොන්ත්‍රාත්කරුවකු නොවන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකුගේ සේවා ;

(viii) යම් ද්‍රව්‍යයක තත්වය හා ස්වභාවය වැඩිදියුණු කිරීමට අදාළව සෘජුවම අදාළ වන සේවා වන එම ද්‍රව්‍යය අපනයනය කරන්නකුට ලබාදෙන සේවා ;

(ix) නිමි ඇඳුම් අපනයනකරුවකුට ලබාදෙන නිමි ඇඳුම් මැසීමේ සේවා ;

(x) ශ්‍රී ලංකාවෙන් යම් ද්‍රව්‍යයක් අපනයනය කරන්නෙකුට ලබාදෙන තාක්දුරට 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති නැව් බඩු ගෙනයන්නකු හෝ නැව් නියෝජිතයකු හෝ එවැන්නකුගේ දූතයකු විසින් සපයනු ලබන සේවා ;

(xi) ලංකාවෙන් යම් ද්‍රව්‍යයක් අපනයනය කිරීම සම්බන්ධයෙන් වනතාක් දුරට රාජ්‍ය සංස්ථාවක් විසින් ලබාදෙන සේවා;

(xii) යම් හෝටලයක්, අමුත්තන්ගේ නිවාසයක්, ආපනශාලාවක් හෝ ඒ හා සමාන වෙනත් ව්‍යාපාරයක් ලංකා සංචාරක මණ්ඩලය වෙත ලියාපදිංචි කර ඇත්නම් එම හෝටලය, අමුත්තන්ගේ නිවාසය, ආපන ශාලව හෝ වෙනත් සමාන ව්‍යාපාර පවත්වාගෙන යාම ;

(xiii) යම් දේශීය නිෂ්පාදන ද්‍රව්‍යයක වෙන්දේසිකරුවකු, තැරව්කරුවකු, රක්ෂණ නියෝජිතයකු හෝ කොමිස් නියෝජිතයකු විසින් සලසනු ලබන සේවා ;

(xiv) යම් ගමන් නියෝජිතයකු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලියාපදිංචි වී ඇත්නම් රට ඇතුළත සංචාර සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් සලසනු ලබන සේවා ;

(xv) ශ්‍රී ලංකාවෙන් පිටත දී පමණක් භාවිත කිරීම සඳහා යම් තැනැත්තකු විසින් පරිඝණක මෘදුකාංග නිපදවන්නේ නම් සහ ඒ සම්බන්ධයෙන් බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදල් වලින් ගෙවීම් කරනු ලබන්නේ නම් එම පරිඝණක මෘදුකාංග නිපදවන්නාගේ සේවා ;

(xvi) විදේශ ව්‍යවහාර මුදල් වලින් ගෙවීම් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තන්ට ද්‍රව්‍ය විකිණීමට හැකි කරවීම හෝ පහසු කරවීම සඳහා හෝ සේවා සැපයීම සඳහා යම් ව්‍යවසායක් විසින් පාරිභෝගිකයන් සඳහා සකස් කරන ලද මෘදුකාංග භාවිත කරමින් අන්තර්ජාලය හරහා සේවා සැපයීම ;

(xvii) විදේශ ව්‍යවහාර මුදල් වලින් ගෙවීම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින හඳුනාගත් සේවා දායකයන් එක් අයකු හෝ ඊට වැඩි ප්‍රමාණයකට යම් ව්‍යාවසායක් විසින් අන්තර්ජාලය හෝ දුරකථන භාවිත කරමින් අනන්‍ය ලෙස සපයනු ලබන සේවාදායකයන්ට සහාය වීමේ සේවා ;

(xviii) ජීවිත රක්ෂණ ව්‍යාපාරය ;

(xix) සිනමා ශාලාවල ප්‍රදර්ශනය කිරීමේ මූලික අරමුණින් යම් සිනමාත්මක චිත්‍රපට බෙදාහැරීම හෝ නිෂ්පාදනය කිරීම හෝ සැපයුම ;

(xx) සිනමා ශාලාවක චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම ;

(xxi) එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ එම සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයකට හෝ යම් විදේශීය රටක දූත මණ්ඩලයකට හෝ එම දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ විදේශ දූත මණ්ඩලයක තත්වය යම් තැනැත්තකුට ඇති බවට විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ලබන යම් නිර්දේශයක් මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් තැනැත්තකුට සපයනු ලබන සේවා ;

(xxii) විදේශ මුදල් ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, විදේශ ව්‍යවහාර මුදල් වලින් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී ඉටු කරනු ලබන යම් සේවාවක්.

## 2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

2002 අංක 11 දරන මුදල් පනත සහ 2004 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:-

I වන කොටස

### 2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම

2. (2006 අංක 48 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත) 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ 2 වන වගන්තිය (වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද) එම වගන්තියේ පළමුවන අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුවද, ඉහත සඳහන් කර ඇති යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් -

(අ) 2004 නොවැම්බර් මස 19 දිනයෙන් ආරම්භ වී 2005 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා සියයට 1.5 ක අනුප්‍රමාණයක වූ බද්දක්;

(ආ) 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2006 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 2.5 ක අනුප්‍රමාණයක බද්දක්;

(ඇ) 2007 ජනවාරි මස 1 වන දින ආරම්භ වී 2008 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන බද්දක්; සහ

(ඇ) 2009 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාල සීමාව සඳහා සියයට 5.0 ක අනු ප්‍රමාණයක බද්දක්,

පනවා අයකර ගනු ලැබිය යුතු ය."

3. මේ කොටසේ විධිවිධාන සියලු කාර්යය සඳහා 2009 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

4. (අ) 2002 මැයි මස 1 වන දිනයෙන් ආරම්භව 2002 ජූලි මස 08 වන දිනයෙන් අවසන් වන කාලය තුළ; සහ

(ආ) 2009 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ,

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාණ්ඩයක් ආනයනය කරනු ලබන තැනැත්තකුගෙන් ඒ භාණ්ඩයේ පිරිවැයෙන්, රක්ෂණ ගාස්තුවෙන් සහ නැව් ගාස්තුවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන මුදලට සමාන මුදලක් අයකර ගනු ලබන අවස්ථාවක දී ඒ මුදල සියලු කාර්යය සඳහා වලංගු ලෙස අය කරගනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර, එසේ අය කර ගැනීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීමේ වගකීමෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

II වන කොටස

## 2004 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම

**5.** 2008 අංක 7 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටසේ (සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක බද්ද පැනවීම) "ජංගම හෝ දුරකථන රැහැන් රහිත ස්ථාවර දුරකථන හෝ සෙලියුලර් ජංගම දුරකථන", යන වචන සඳහන් කර ඇති කවර හෝ ස්ථානයක ඒ වෙනුවට "දුරකථනය" යන වචනය ආදේශ කිරීමෙන් එම කොටස තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ දී ඇති අර්ථයම ඇත්තේ ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ දී ඇති අර්ථය ඇත්තේය:

එසේ වුව ද දුරකථන භාවිත කරන්නකු වෙත තුන්වන පාර්ශ්වයක් විසින් සපයනු ලබන සේවා සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් එම දුරකථන භාවිත කරන්නාගෙන් දුරකථන ක්‍රියාකරු විසින් එකතු කර ගන්නා ලද මුදල එම වටිනාකමට ඇතුළත් නොවිය යුතු ය.

"දුරකථන ක්‍රියාකරු" යන්නෙන්, ජංගම හෝ රැහැන් රහිත ස්ථාවර හෝ රැහැන් සහිත ස්ථාවර දුරකථනයක ක්‍රියාකරු අදහස් වේ.".

**7.** මෙම පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසට සහ 14 වන වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්යය සඳහා 2009 ජනවාරි මස 15 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

8. 2009 ජනවාරි මස 15 වන දිනයෙන් ආරම්භව මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුල දී යම් බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරුවකු විසින් යම් පාවිච්චි කරන්නකුගෙන් අයකර එකතු කරගන්නා ලද බදු මුදල වලංගු ලෙස

පනවා අයකරගෙන ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එම බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීමේ වගකීමෙන් ඒ ක්‍රියාකරු මෙයින් ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 14 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 14 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනු ඡේදයේ "යම් ලිඛිත නීතියක් යටතේ ඒ භාණ්ඩය ආනයනය කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු, සෙස් බදු හා අයකිරීම් සියල්ලේ එකතුවට සමාන මුදලක්" යන වචන වෙනුවට "රේගු බද්ද අධිභාරය, සෙස් බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ එකතු කළ අගය මත බදුවල මුළු එකතුවට සමාන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : -

1. මේ පනත 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මෙහි මින් මතු ,ප්‍රධාන ප්‍රඥප්තිය, යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (iii) උප ඡේදයේ ,2005 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාල සීමාවක්, යන වචන සහ ඉලක්කම් වෙනුවට “2005 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2009 ජනවාරි මස 01 වන දිනට පෙරාතුව වූ යම් බදු අය කළ හැකි කාල සීමාවක්” යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන උප ඡේදයේ ,(v) 2005 ජනවාරි මස 1 වන දින හෝ, යන වචන හා ඉලක්කම්වල සිට "හතරවන උපලේඛනයේ නිශ්චිතව ම සඳහන් භාණ්ඩ සහ සේවා" යන වචන හා ඉලක්කම් දක්වා කොටස ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(v) (i) 2005 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එහෙත් 2009 ජනවාරි මස 01 වන දිනට පෙරාතුව වූ යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා-

(අ) ශුන්‍ය අනුප්‍රමාණය මත බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා; සහ

(ආ) මේ පනතේ හතර වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් හැර සපයන ලද භාණ්ඩ හෝ සේවා හෝ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම අනුව සියයට පහළොවක අනුප්‍රමාණය (සම්මත අනුප්‍රමාණය) (එහි බදු ඛණ්ඩය 3/23ක් වේ.) මත බදු අය කරනු ලැබිය යුතු ය;

(ii) 2009 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා -

(අ) ශුන්‍ය අනුප්‍රමාණ මත බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා; සහ

(ආ) මේ පනතේ හතර වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවා,

සම්බන්ධයෙන් හැර, එම සපයන ලද භාණ්ඩ හෝ සේවාවල වටිනාකම හෝ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම අනුව සියයට දොළහක අනුප්‍රමාණ (සම්මත අනුප්‍රමාණය) (එහි බදු ඛණ්ඩය 3/28ක් වේ.) මත බදු අය කළ යුතු ය.

(ඇ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලයේ අනුමතය ඇතිව —

(i) එම සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද යම් භාණ්ඩවල සැපයුම් මත සහ මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති භාණ්ඩවල හැර අපනයනකරුවන් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයන් විසින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා යොදා ගැනීමට යම් නිෂ්පාදකයකු වෙත එම සැපයුම්කරුවන් විසින් සපයන ලද සැපයුම් මත ; හෝ

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා හඳුනා ගනු ලැබූ සේවා සැපයුමක් ලෙස එකී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවාවක් වන්නා වූ ද, භාණ්ඩ අපනයන කිරීම සඳහා එකී ශ්‍රී ලංකා අපනයන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයකු විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල තත්ත්වය, ස්වභාවය හෝ වටිනාකම වැඩිදියුණු කිරීමේ ප්‍රතිඵලය ඇති කරන්නා වූ ද, එවැනි සැපයුම්කරුවන් විසින් එම නිෂ්පාදකයා වෙත කරනු ලබන යම් සේවාවක් මත,

අපනයන සංවර්ධන මණ්ඩලය විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, එම නිෂ්පාදකයන්ගේ හෝ සේවා සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් සමීක්ෂණය කර එම භාණ්ඩ බැහැර කිරීම පිළිබඳව කොමසාරිස්-ජනරාල්වරයා නියම කරනු ලබන ආකාරයට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි සත්‍ය වශයෙන්ම එම භාණ්ඩ සැපයුම්ලාභීන් විසින් අපනයනය කරන බවට කාර්තු පදනම මත සපයන්නා වූ එම භාණ්ඩ බැහැර කිරීමේ සැපයුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන තාක්කල්;"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "10 (1) යන ඉලක්කම්වල සිට" මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය." යන වචන දක්වා කොටස ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"10 (1) (i) 2002 අගෝස්තු මස 01 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2009 ජනවාරි මස 01 වන දිනට පෙරාතුව ශ්‍රී ලංකාවෙහි යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් පවත්වාගෙන යන හෝ ක්‍රියාත්මක කරන සෑම තැනැත්තෙක්ම -

(අ) අවස්ථාවෝචිත පරිදි, එක් මාසයක හෝ මාස තුනක බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ දී, ශ්‍රී ලංකාව තුළ, අවස්ථාවෝචිත පරිදි, එකී බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව ඇතුළත දී කරන ලද බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුමේ නැතහොත් භාණ්ඩ සහ සේවා සැපයුමේ මුළු වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්මවන්නේ නම් ; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ ඔහුගේ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුමේ නැතහොත් භාණ්ඩ සහ සේවා සැපයුමේ මුළු වටිනාකම රුපියල් ලක්ෂ දහ අටක් ඉක්ම වන්නේ නම්; හෝ

(ඇ) කවර හෝ අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඊළඟ එක් එක් මාසයක හෝ මාස තුනක බදු අය කළ හැකි කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ ඔහුගේ භාණ්ඩ හෝ සේවාවල නැතහොත් භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල මුළු වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්මවිය හැකි බවට හෝ පසුව එළඹෙන මාස දොළහක කාල සීමාව තුළ දී එය රුපියල් ලක්ෂ දහ අටක් ඉක්මවිය හැකි බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි විය යුතු බවට නියම කරනු ලැබිය යුතු ය."

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්: -

"(ii) 2009 ජනවාරි මස 01 වන දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවේ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ එවැනි ක්‍රියාකාරකමක් කරගෙන යනු ලබන සෑම තැනැත්තෙක්ම, -

(අ) අවස්ථාවෝචිත පරිදි, බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී ශ්‍රී ලංකාව තුළ, අවස්ථාවෝචිත පරිදි, එකී බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාල සීමාව ඇතුළත ඔහුගේ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුමේ නැතහොත් භාණ්ඩ සහ සේවා සැපයුමේ මුළු වටිනාකම, රුපියල් හයලක්ෂ පනස් දහසක් ඉක්මවන්නේ නම්; හෝ

(ආ) එවකට අවසන්වන මාස දොළහක කාලසීමාව තුළදී ශ්‍රී ලංකාව තුළ ඔහුගේ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුමේ නැතහොත් භාණ්ඩ සහ සේවා සැපයුමේ මුළු වටිනාකම රුපියල් ලක්ෂ විසිපහක් ඉක්මවන්නේ නම්; හෝ

(ඇ) කවර හෝ අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඊළඟ එක් එක් මාස එකක හෝ මාස තුනක බදු අය කළ හැකි කාල සීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ ඔහුගේ භාණ්ඩ හෝ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල මුළු වටිනාකම රුපියල් හය ලක්ෂ පනස් දහසක් ඉක්මවිය හැකි බවට හෝ පසුව එළඹෙන මාස දොළහක කාල සීමාව තුළ දී එය රුපියල් ලක්ෂ විසිපහක් ඉක්මවිය හැකි බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි විය යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ හතරවන අතුරු විධානයේ "සියයට පහළොවකට සීමා කළ යුතු ය." යන වචන වෙනුවට "සියයට දොළහකට සීමා කළ යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) 5 වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ආ) ඡේදයේ (i) වන උපඡේදයේ "අදාළ ලියාපදිංචි තැනැත්තා විසින් මාස තුනක කාලසීමාවකට වලංගු බැංකු ඇපකරයක් හෝ රක්ෂණ බැඳුම්කරයක්" යන වචන වෙනුවට "අදාළ ලියාපදිංචි තැනැත්තා විසින් කොමසාරිස්-ජනරාල්වරයා තීරණය කරන වටිනාකමකින් යුක්ත වූ මාස තුනක කාලසීමාවකට වලංගු බැංකු ඇපකරයක් හෝ රක්ෂණ බැඳුම්කරයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (6) වන උපවගන්තියේ (iv) වන උපඡේදයේ "(iv) අවස්ථාවෝචිත පරිදි (iii) වන ඡේදයේ සඳහන් කර ඇති බදු ඉන්වොයිස් පත්‍රය" යන වචනවල සිට "අඩු කර නොමැති නම්" යන වචන දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iv) (අ) (iii) වන ඡේදයේ සඳහන් යම් බදු ඉන්වොයිස් පත්‍රයක් මත වූ යෙදවුම් බද්ද එම බදු ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට මාස දොළහක කාලයක් අවසන් වන දිනයේ දී හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාල සීමාවක් තුළ දී, සහ එම කාලසීමාව සඳහා වූ වාර්තාව ඉදිරිපත් කිරීම මගින් මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එම කාලසීමාව සඳහා වූ නිමැවුම් බද්දෙන් අඩු කරනු ලැබ නැත්නම්; හෝ

(ආ) (iii) වන ඡේදයේ දක්වා ඇති යම් රේගු ප්‍රකාශනයක් මත වූ යෙදවුම් බද්ද එම රේගු ප්‍රකාශයේ සඳහන් දිනයේ සිට මාස විසි හතරක් අවසන් වන දිනයේ දී හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් තුළ දී සහ එම කාලසීමාව සඳහා වූ වාර්තාව ඉදිරිපත් කිරීම මගින් මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එම කාලසීමාව සඳහා වූ නිමැවුම් බද්දෙන් එම ඉන්වොයිස් පත්‍රය මත වූ යෙදවුම් බද්ද අඩු කරනු ලැබ නැත්නම්;

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ "2007 දෙසැම්බර් මස 31 දිනට පෙර ක්‍රියාත්මක වන පරිදි සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "2007 දෙසැම්බර් මස 31 වන දිනට පෙර ක්‍රියාත්මක වන පරිදි" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (iii) වන ඡේදයේ "2008 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ක්‍රියාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2008 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2009 ජනවාරි මස 1 වන දිනට පෙර ක්‍රියාත්මක වන පරිදි හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (iii) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(iv) 2009 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ජාතික රාජ්‍ය සභාව විසින් ක්‍රියාත්මක වන පරිදි 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් හෝ 1951 අංක 38 දරන පනත යටතේ පිහිටුවන ලද ලොහෝර් ආර්යා ණය අරමුදල හැර වෙනත් යම් තැනැත්තකු;"

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 25එ වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එම තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුළු පිරිවැටුම වර්ෂයකට රුපියල් ලක්ෂ විසිපහක් වන්නේ කවර කාර්තුවේ දී ද, එම කාර්තුවේ අවසානය දක්වා යන ඒවායින් පළමුව එළඹෙන කාර්තුව දක්වා ඒ ලියාපදිංචි කිරීම වලංගු විය යුතුයි" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(i) තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුළු පිරිවැටුම -

(අ) 2009 ජනවාරි මස 01 වන දිනට පෙරාතුව වූ යම් කාලයක් සඳහා වර්ෂයකට රුපියල් ලක්ෂ විසි පහක් ඉක්මවීම;

(ආ) 2009 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලයක් සඳහා රුපියල් ලක්ෂ තිහක් ඉක්මවීම,

සිදුවන්නේ කවර කාර්තුවක දී ද එම කාර්තුවේ අවසානය දක්වා සහ ඒවායින් පළමුව එළඹෙන අවස්ථාව දක්වා ඒ ලියාපදිංචි කිරීම වලංගු විය යුතුය."

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) (අ) කරගෙන යන සෑම බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට මුළු පිරිවැටුම, 2009 ජනවාරි මස 01 වන දිනට හෝ පෙරාතුව වූ යම් කාලයක් සඳහා වර්ෂයකට රුපියල් විසිපත් ලක්ෂයක් නොඉක්මවන්නා වූ හෝ කාර්තුවකට රුපියල් හය ලක්ෂ විසිපන්දහසක් නොඉක්මවන්නා වූ ; සහ

(ආ) කරගෙන යන සෑම බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට මුළු පිරිවැටුම 2009 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලයක් සඳහා වර්ෂයකට රුපියල් ලක්ෂ තිහක් නොඉක්මවන්නා වූ හෝ කාර්තුවකට රුපියල් හත් ලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නා වූ ;" සහ

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1අ) 34 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද යම් වලංගු අභියාචනයක් ඔහු විසින් සමාලෝචන මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, සමාලෝචන මණ්ඩලය විසින් එම අභියාචනය විභාග කර තීරණය කළ යුතු ය. එසේ යොමු කරන ලද යම් අභියාචනයක් විභාග කර තීරණය කිරීම සම්බන්ධයෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 169 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ (සස) වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම කොටස් (අ) ඡේදයේ —

(අ) (xii) අයිතමයේ "2008 දෙසැම්බර් මස 31 වන දිනට වඩා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2010 දෙසැම්බර් මස 31 වන දිනට වඩා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (xv) අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීමෙන් :-

"(xvi) රේගු කාර්යය සඳහා විශේෂිත ඒකාබද්ධ භාණ්ඩ විස්තර යටතේ හඳුනා ගත් සූර්ය බලශක්ති උත්පාදනය සඳහා වූ සෝලා පැනල් මොඩියුල් යන උපකරණ (2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි);

(xvii) රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් ටිකට් පත් නිකුත් කිරීමේ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන ලද අධි තාක්ෂණික වෛද්‍ය උපකරණ හෝ වෙනත් යම් යන්ත්‍රෝපකරණ.".

(2) එම කොටසේ (ආ) ඡේදයේ—

(අ) (xxvi) අයිතමයේ "(2008 01. 01 දින සිට බලාත්මක වන පරිදි) සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට, "(2008 01.01 දින සිට බලාත්මක වන පරිදි)" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (xxvii) අයිතමයේ "(2008.01.01 දින සිට බලාත්මක වන පරිදි)" යන වචන හා ඉලක්කම් වෙනුවට, "(2008.01.01 දින සිට බලාත්මක වන පරිදි)" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (xxvii) අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:—

"(xxviii) තේ කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන්නාවූද, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ යන්ත්‍රෝපකරණයක් ලෙස හඳුනාගනු ලැබුවා වූද දේශීය වශයෙන් නිෂ්පාදිත යන්ත්‍රෝපකරණ (2008.10.01 දින සිට බලාත්මක වන පරිදි);

(xxix) ශල්‍යකර්ම සඳහා භාවිතා කරනු ලබන දේශීය වශයෙන් නිෂ්පාදිත ශල්‍යකර්ම ගෝස් (2009 .01.01) දින සිට බලාත්මක වන පරිදි);

(xxx) දේශීය වශයෙන් නිෂ්පාදිත ස්වර්ණාභරණ (2009.01.01) දින සිට බලාත්මක වන පරිදි)".

(3) එම කොටසේ (ඇ) ඡේදයේ—

(අ) (xxiii) අයිතමයේ "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියෙන්" යන වචන වෙනුවට "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියෙන් හෝ විශේෂ ව්‍යාපෘතියක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (xxiii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන්:—

"(xxiv) ත්‍රස්තවාදී ක්‍රියාකාරකමකින් විනාශයට පත් වූ යම් බස් රථයක් ප්‍රතියෝජනය කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ හෝ යම් ප්‍රාදේශීය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක අනුමතය ඇතිව, එම බස් රථයේ අයිතිකරු විසින් එම බස් රථය ආනයනය කිරීම (2008.07.09 දින සිට බලාත්මක වන පරිදි) ;

(xxv) ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අනුමතය ඇතිව ජාතික ශිල්ප සභාව විසින් පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා පිත්තල, තහඩු, පිත්තල ඇන, නූල් ඩයි වර්ග, පැරපින් ඉටි ලාකඩ ආනයනය කිරීම (2009.01.01. දින සිට බලාත්මක වන පරිදි) ;

(xxvi) විදුලි බලය උත්පාදනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් රසායනික නැප්තා ආනයනය කිරීම (2009.01.01 සිට බලාත්මක වන පරිදි) ;

(xxvii) සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ඖෂධ ඇසිරීම සඳහා පමණක් භාවිත කරනු ලබන්නා වූ ද, එවැනි ඇසුරුම් ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන තාක්, ඖෂධ නිෂ්පාදකයන් විසින් එවැනි ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීම;

(xxviii) ජාතික චිත්‍රපටි සංස්ථාවේ සභාපතිවරයාගේ අනුමතය ඇතිව, රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් චලචිත්‍රපටි, විවෘත හෝ වැඩි දියුණු කරන ලද සිනමා චිත්‍රපටි, චුම්බක සිනමා ශබ්ද පටි, සිනමාශාලා කැමරා සහ පොජෙක්ටර් කොටස් සහ අමතර කොටස්, සිනමා චිත්‍රාගාර සඳහා උපාංග සහ උපකරණ, විද්‍යුත් පිලමන්ට් හෝ පත්තු කරන ලාම්පු සහ චක්‍රාකාර ලාම්පු."

(4) එම කොටසේ (ඊ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(උ) ජාතිය ගොඩනැගීමේ හා රාජ්‍ය යටිතල පහසුකම් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, ජනතා සහභාගීත්වය හරහා ක්‍රියාත්මක කරනු ලබන ගම නැගුම, මගනැගුම, සමෘද්ධි ව්‍යාපෘති හා ජනතා වාරිමාර්ග ව්‍යාපෘති සඳහා වූ ඉදිකිරීම් සේවා වන සේවා සැපයුම (2009.01.01 දින සිට බලපවත්වන පරිදි)".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ "තුන්වන උපලේඛනය" යන ශීර්ෂයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

"2009 ජනවාරි මස 01 වන දිනට පෙරාතුව අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා"

**10.** (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට, මේ පනතේ 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධන, සියලු කාර්යය සඳහා 2008 ජුනි මස 01 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය;

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට, මේ පනතේ 4 වන වගන්තියේ (1), (2) සහ (3) වන උපවගන්ති මගින් කරන ලද සංශෝධන සියලු කාර්යය සඳහා 2009 ජනවාරි මස 01 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය;

(ඇ) ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට මේ පනතේ 7 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනය සියලු කාර්යය සඳහා 2009 ජනවාරි මස 01 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

**11.** 2009 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා මේ පනතේ විධිවිධාන සලසා තිබෙන පරිදි එකතු කළ අගය මත බදු එකතු කරන යම් තැනැත්තකු, නිසි බලය ඇතිව ක්‍රියා කළ ලෙසත් එම බදු එකතු කිරීම වලංගු ලෙස සිදුකර ඇති බව හා කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩු පැවරීම්වලින් ඒ තැනැත්තන් මුක්ත කරනු ලැබිය යුතු ය.

**12.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :"

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඇති අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද, යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් අය කරනු ලබන සේවා ගාස්තුව, කිසිම අවස්ථාවක —

(i) 2009 මාර්තු 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් අදාළ කාර්තුවක් සඳහා රුපියල් මිලියන පහළොවක් නොඉක්මවිය යුතු ය. තව ද ;

(ii) 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා රුපියල් මිලියන තිහක් නොඉක්මවිය යුතු ය."

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි :—

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයට ඇති අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (අ) උපඡේදයේ (ii) වන අයිතමයේ "ප්‍රාග්ධන වත්කමක්" යන වචන වෙනුවට "ප්‍රාග්ධන වත්කමක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (අ) උපඡේදයේ (සසස) වන අයිතමයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

"(iv) (2008 ඔක්තෝබර් මස 21 වන දින සිට බලපවත්වන පරිදි) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් යුත් සෛවරී බැඳුම්කර යම් වාණිජ බැංකුවකට හෝ යම් අනේවාසික තැනැත්තෙකුට විකිණීමෙන් ලැබෙන මුදල් ;

(v) (2008 ජුනි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) භාණ්ඩාගාර බිල්පත් බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමෙන් ලබාගන්නා ලද අරමුදල්වලින් මිලදී ගන්නා ලද ;

(අ) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බිල්පත්; හෝ

(ආ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බැඳුම්කර,

විකිණීමෙන් උපචිත ලැබීම් ;

(vi) 2009 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන එහෙත් 2009 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර දිනයක නොවන්නා වූ යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ අපනයනයෙන් වන ලැබීම්;

(vii) 2009 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර දිනයක නොවන්නා වූ, එහෙත් 2009 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන්පසුව බලපැවැත්වෙන පරිදි යම් අපනයනකරුවකු විසින් අපනයනය සඳහා තවදුරටත් සකස්

කිරීමක් හෝ නිෂ්පාදනය කිරීමක් සිදු නොකර යම් අයිතමයක් හෝ භාණ්ඩයක් නිෂ්පාදනය කරන්නකු විසින් යම් අපනයනකරුවකුට අපනයනය සඳහා කරනු ලබන සැපයුම්වලින් උපචිත වන ලැබීම් ;

(viii) 2005 අංක 38 දරන සංචාරක පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ, යම් —

(අ) සංචාරක හෝටලයක;
(ආ) දේශීය සංචාරක ක්‍රියාකරුවකුගේ ; හෝ
(ඇ) දේශීය සංචාරක නියෝජිතයකුගේ

ක්‍රියාකාරකම්වලින්, 2009 ජනවාරි 1 වන දිනට පසුව එහෙත් 2009 දෙසැම්බර් මස 31 වන දිනයට පෙර අවස්ථාවෝචිත පරිදි, එකී හෝටලයේ ක්‍රියාකරුවා හෝ නියෝජිතයාගේ ලැබීම් ; සහ'' ; සහ

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඇති අතුරු විධානයේ (අ) ඡේදයේ ''ඒ බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තව ද'' යන වචන වෙනුවට ''එම බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතුය.'' යන වචන ආදේශ කිරීමෙන් ;

මෙම ඡේදයේ කාර්යය සඳහා ''බැංකුව'' යන්නට මුල්‍ය ආයතනයක් හෝ උකස් තැරැව්කරුවකු ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

''මුල්‍ය ආයතනය'' යන්නෙන්, මුදල් භාර ගැනීම තමන් වෙනුවෙන්ම කරනු ලැබුව ද නැතහොත් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කරනු ලැබුව ද තැන්පතු හෝ ඍණ පත්‍ර බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් වූ ණය මගින් සහ ඒ මත පොලිය ගෙවීමේ ව්‍යාපාරය හෝ ඒ ව්‍යාපාරයේ කොටසක් සමන්විත වන සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ අදහස් වේ; සහ''.

3. මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් සහ (2) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට කරන ලද සංශෝධන 2009 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්විය යුතු ය.

4. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 17 දරන හර බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

**2002 අංක 16 දරන හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 17 දරන හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 16 දරන හර බදු පනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

''(3) (අ) යම් වාණිජ බැංකුවක්, විශේෂිත බැංකුවක්, මුදල් සමාගමක් හෝ බලයලත් වෙළෙන්දකු -

(i) ප්‍රමාණවත් මුදල් ඇති යම් ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හර බද්ද අස්කර ගැනීම හෝ ප්‍රේෂණය කිරීම පැහැර හරින අවස්ථාවක ;

(ii) 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමේ දී උපලබ්ධ වන මුදල් ප්‍රමාණයෙන් හර බද්ද අඩු කිරීම හෝ ප්‍රේෂණය කිරීම පැහැර හරින අවස්ථාවක,

එම වාණිජ බැංකුව, විශේෂිත බැංකුව, මුදල් සමාගම හෝ බලයලත් වෙළෙන්දා, ගෙවිය යුතු සම්පූර්ණ හර බදු ප්‍රමාණය සඳහා ගෙවීම පැහැර හැර ඇත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, එසේ අස්කර නොගත්, අඩු කරනු නොලැබූ හෝ ප්‍රේෂණය කරනු නොලැබූ සම්පූර්ණ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුව තිබූ දිනයට පසුව එළඹෙන දිනයේ සිට එකී සම්පූර්ණ මුදල ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සම්පූර්ණ මුදල මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට එම වාණිජ බැංකුවෙන්, විශේෂිත බැංකුවෙන්, මුදල් සමාගමෙන් හෝ බලයලත් වෙළෙන්දාගෙන් අයකර ගත යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් හර බදු ප්‍රමාණය, අදාළ වාණිජ බැංකුවෙන්, විශේෂිත බැංකුවෙන්, මුදල් සමාග මෙන් හෝ බලයලත් වෙළෙන්දාගෙන් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් අය කර ගැනීම සඳහා නැතහොත් එකී මුදල ඉල්ලා අස්කර ගත යුතුව තිබූ හෝ අඩු කරගත යුතුව තිබූ තැනැත්තාගෙන් සම්පූර්ණයෙන් අය කර ගැනීම සඳහා සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන පියවර ගැනීමෙන්, කොමසාරිස් ජනරාල්වරයා වලක්වනු ලබන පරිදි මේ වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

3. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය, පැවැත්විය යුතු ය.

## 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

**2005 අංක 5 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:

1. මේ පනත 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටසේ 13 වන වගන්තියේ (ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද) "එක් එක් කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු සම්පූර්ණ පිරිවැය මත පදනම් විය යුතු ය" යන වචන වෙනුවට "එක් එක් කොන්ත්‍රාත්කරුට හෝ උප කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම මත පදනම් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 13අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:

"යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද අඩු කරගත යුතු බව.

13අ. (1) 2005 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ඇතුළත් වූ යම් ගිවිසුමක් යටතේ, අවස්ථාවෝචිත පරිදි, යම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන යම් ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවක හෝ උප කොන්ත්‍රාත්තුවක වටිනාකම මත යම් මුදලක් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් එම කොන්ත්‍රාත්කරුට හෝ උපකොන්ත්‍රාත්කරුට 2009 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ගෙවනු ලබන අවස්ථාවක එම ගෙවන මුදලින් මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උචිත අනුප්‍රමාණයකට අනුව ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද, අඩු කළ යුතු බවටත්, එසේ අඩු කර ගන්නා ලද මුදල පිළිබඳ විස්තර දැක්වෙන ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘති පත්‍රයක් මගින් එම කොන්ත්‍රාත්කරුට හෝ උප කොන්ත්‍රාත්කරුට නිකුත් කළ යුතු බවටත්, එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නියම කරනු ලැබිය යුතු ය.

(2) ආදායම් බද්ද අඩු කිරීම, ආදායම් බද්ද අඩු කිරීම පැහැර හැරීම්, බැංකු සහ මුල්‍ය ආයතන වෙත තක්සේරු කිරීම් නිකුත් කිරීම, ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් වූ අභියාචන සහ දණ්ඩන පිළිබඳව වූ බැංකු සහ මුල්‍ය ආයතනවල කාර්යභාරයට අදාළ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 140, 142, 143, 144 සහ 145 යන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද, ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද අඩුකිරීම, ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද අඩුකිරීම පැහැර හැරීම, එකී තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර මත තක්සේරු කිරීම් නිකුත් කිරීම, ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් වූ අභියාචන සහ දණ්ඩනවලට අදාළ විය යුතු ය.

(3) ඉහත කී උපවගන්ති යටතේ ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද වශයෙන් අඩු කර ගන්නා ලද මුදල, එම මුදල අඩු කරගත් මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලබන එම අඩු කිරීම් පිළිබඳ විස්තර සඳහන් වන ප්‍රකාශයක් ද සමග එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.

(4) එසේ අඩු කර ගැනීමට සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට අදාළ සහතිකය ඉදිරිපත් කිරීමෙන් එම මුදල ගෙවන අවස්ථාවේ දී අදාළ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද වශයෙන් අඩු කර ගන්නා ලද මුදල 13 වන වගන්තිය යටතේ එම කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල බදු මුදලින් අඩු කර ගැනීමට එම කොන්ත්‍රාත්කරුට හෝ උප කොන්ත්‍රාත්කරුට හිමිකමක් තිබිය යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "13 වගන්තිය යටතේ ගෙවිය යුතු ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්ද එක් එක් කොන්ත්‍රාත් මුදල්, කොන්ත්‍රාත්කරුට ලැබෙන අවස්ථාවේ දී ඉදි කිරීම් කොන්ත්‍රාත්කරු විසින්" යන වචන වෙනුවට"13 වනවගන්තිය යටතේ කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්දෙන් 13 අ වගන්තිය යටතේ ගෙවන තැනැත්තා විසින් අඩු කර ගනු ලබන බද්ද අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල එක් එක් කොන්ත්‍රාත් මුදල් ලැබෙන අවස්ථාවේ දී, ඉදි කිරීම් කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින්෴ යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ "කොන්ත්‍රාත් වටිනාකම" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"කොන්ත්‍රාත් වටිනාකම" යන්නෙන් පිළිගැනීමේ ලිපියෙහි සඳහන් වන්නා වූ ද ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ඉන්පසු වෙනස් කරනු ලබන්නා වූ ද මුදල හෝ මුදල් අදහස් වේ. එම කොන්ත්‍රාත් වටිනාකම වනුයේ ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් එළඹ ඇති එක් එක් කොන්ත්‍රාත්තුව හෝ කොන්ත්‍රාත්තු කීපයක මුළු එකතුව වන අතර, උප කොන්ත්‍රාත් වටිනාකම, සැපයුම් කොන්ත්‍රාත් වටිනාකම සහ වැඩ කටයුතු ඉටු කිරීමේ දී දැරීමට සිදු වන වෙනත් ඉදි කිරීම් වියදම් ද ඊට ඇතුළත් වන නමුත්, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ යම් එකතු කළ අගය මත බද්දක් ඊට ඇතුළත් නොවිය යුතු ය; සහ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනයේ 4 වන, 5 වන කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය සංශෝධනය කිරීම .

"4. (අ) 2005 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2006 මාර්තු මාසයෙන් අවසන් වන කාල සීමාවට අදාළ වන තාක් දුරට (XV, XVI සහ XVII වන පරිච්ඡේදවල විධිවිධාන සහ 33 වන වගන්තියේ සහ 61 වන වගන්තියේ විධිවිධාන හැර) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත;

(ආ) 2006 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 2008 මාර්තු මාසයෙන් අවසන් වන කාල සීමාව සඳහා අදාළ වන තාක් දුරට (XVI, XVII, XVIII සහ XXI වන පරිච්ඡේදවල විධිවිධාන සහ 36 වන වගන්තියේ සහ 65 වන වගන්තියේ විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත; සහ

(ඇ) යම් සමාගමකට සහ 2008 අප්‍රේල් මස 1 වන දිනයට පසුව ආරම්භ වන කාල සීමාවක් සම්බන්-ධයෙන් අදාළ වනතාක් දුරට (XVI, XVII, XVIII සහ XXI වන පරිච්ඡේදවල විධිවිධාන සහ 36 වන වගන්තියේ සහ 65 වන වගන්තියේ විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :"

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) එහි 2 වන අයිතමයේ "රුපියල් මිලියන පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් මිලියන පනහකට අඩු" යන වචන ආදේශ කිරීමෙන්ත සහ

(2) එහි 3 වන අයිතමයෙහි "රුපියල් මිලියන එකසිය පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් මිලියන එකසිය පනහකට අඩු" යන වචන ආදේශ කිරීමෙන්.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තියේ (ආ) ඡේදයෙහි (lix) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීම මගින්, එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:"

"(lx) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව;".

3. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර ශ්‍රී ලංකාවේ දී ඇති වන පඩිනඩි" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ දී ඇති වන පඩිනඩි" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යන දින දෙකින් වඩා කලින් එළඹෙන එහෙත් 2008 අප්‍රේල් මස 1 වන දිනට පසුව නොවන දිනයක් දක්වා", යන වචන වෙනුවට "යන දින දෙකින් වඩා කලින් එළඹෙන දිනය දක්වා" යන වචන ආදේශ කිරීමෙන්.

4. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (ඊ) ඡේදයේ "යම් තැනැත්තකුට උපචිත වන පොළිය;,, යන වචන වෙනුවට "2009 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර යම් තැනැත්තකුට උපචිත වන පොළිය, යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:"

"(ග) මේ පනතේ 132 වන වගන්තියෙහි අර්ථ නිරූපණය කර ඇති පරිදි යම් ආණ්ඩුවේ ආයතනයක යම් සේවා නියුක්තිකයකුට, ලාහෝර් ආර්යා ණය අරමුදල මගින් ප්‍රදානය කර ඇති යම් ණය මුදලක් මත එම අරමුදලට උපචිත වන පොළිය"

5. 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (ඇඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇඇඇ) මේ වගන්තියේ (ඇඇඇ) ඡේදයේ කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක්, වාසික පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ලබාදෙන යම් සේවාවක් වෙනුවෙන් 2009 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2011 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා, විදේශීය ව්‍යවහාර මුදලින් උපයනු ලබන ලාභ සහ ආදායම් (කොමසාරිස් ජනරාල්වරයා විසින් සාධාරණ යැයි සලකනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත දී වියදම් කරන ලද යම් වියදම් ඇත්නම්, ඒ වියදම් අඩු කිරීමෙන් පසු), එකී ලාභ සහ ආදායම් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබ ඇත්නම් ;"

(2) එම වගන්තියේ (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ටට) 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් තැනැත්තකු විසින් ලියන ලද සහ ඔහු විසින් ම නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් පළ කරන ලද යම් පොතක් විකිණීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් උපචිත වූ, ද එම පොත පළමු වරට පළ කිරීමේ දින සිට ආරම්භ වන අවුරුදු එකක කාලයක් සඳහා එම තැනැත්තාගේ ලාභ සහ ආදායමෙන් හරි අඩක්;

(ටටට) 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් යම් නාට්‍යයක් නිෂ්පාදනය කිරීමෙන් උපචිත වූ ද එම නාට්‍යය පළමු වරට මහජනතාව වෙත රඟ දැක්වීමේ දින සිට ආරම්භ වන අවුරුදු එකක කාලයක් සඳහා, ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායමෙන් හරි අඩක්;

මේ ඡේදයේ කාර්යය සඳහා "නාට්‍යය" යන්නෙන් ලිඛිත, වාචික හෝ වෙනත් ආකාරයක පාඨයක් මත පදනම් වී වේදිකාවක් හෝ වෙනත් සුදුසු අවකාශයක් මත නළු නිළියන්ගේ නාට්‍යමය රඟ දැක්වීමක් හරහා කථාවක් හෝ වෙනත් කථා වෘතාන්තයක් නාට්‍යමය ඉදිරිපත් කිරීමක් ලෙස ජනතා සමූහයක් සඳහා ගෙන දැක්වීම අදහස් වේ;

(ටටටට) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත මගින් පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලය විසින්, අපනයන සංවර්ධන දිරි දීමනා යෝජනා ක්‍රමය යටතේ අපනයනකරුවකුට ගෙවනු ලබන යම් අපනයන සංවර්ධන ප්‍රතිදානය ;";

(3) එම වගන්තියේ (බබ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:—

"(බබබ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් 2008 ඔක්තෝබර් මස 21 වන දින හෝ එදිනට පසුව නිකුත් කරන ලද විදේශීය ව්‍යවහාර මුදල්වලින් වටිනාකම නියම කර ඇති ස්වෛරී බැඳුම්කර නිකුත් කරන්නකු විසින්, ශ්‍රී ලංකාවේ යම් අනේවාසික තැනැත්තකුට හෝ යම් බලපත්‍රලාභී වානිජ බැංකුවකට, අවස්ථාවෝචිත පරිදි, ගෙවන ලද හෝ අවසර දී ඇති පොලියකට හෝ වට්ටම් මුදලකට සමාන මුදලක්;

(බබබබ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ඇමරිකානු ඩොලර්වලින් වටිනාකම නියම කර ඇති ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත, 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, අවසර දී ඇති පොලිය හෝ වට්ටම් මුදලකට සමාන මුදලක්;

(බබබබබ) (i) යම් අනේවාසික තැනැත්තකු හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් (බබබ) ඡේදයේ සඳහන් ස්වෛරී බැඳුම්කරයක් විකිණීමෙන් ; හෝ

(ii) යම් තැනැත්තකු විසින් 2009 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු (බබබබ) ඡේදයේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරයක් විකිණීමෙන්,

ලබන හෝ උපචිත වන යම් ලාභ සහ ආදායම්;".

(4) එම වගන්තියේ (මම) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(මමම) 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් ගීතයකින් හෝ වෙනත් සංගීතමය නිර්මාණයකින්, අවස්ථාවෝචිත පරිදි, එහි පද රචකයාට, සංගීත තනු රචකයාට හෝ ගායකයාට ලැබෙන හෝ උපචිත වන යම් ලාභයක් හෝ ආදායමක්;"; සහ

(5) එම වගන්තියේ (යයය) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(යයයය) මේ පනතේ 9 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් ගිණුමක 2009 පෙබරවාරි මස 1 වන දින හෝ එදිනට පසුව තැන්පත් කරනු ලැබ එහි බැරට ඇති මුදල් භාවිතා කරමින්, ආර්ථික පුනර්ජීවන සහතිකවල ආයෝජනය කිරීමෙන් යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට උද්ගත වන හෝ උපචිත වන යම් ලාභ සහ ආදායම:

එසේ වුව ද, ආර්ථික පුනර්ජීවන සහතිකවල කරන ලද ආයෝජනය, කොටසක් 2009 පෙබරවාරි මස 1 වන දින හෝ එදිනට පසුව තැන්පත් කරන ලද මුදල්වලින් ද, ඉතිරි කොටස එම දිනය වන විට එම ගිණුමේ එවකට බැරට තිබූ මුදල්වලින් ද කරනු ලැබූ අවස්ථාවක දී, මේ ඡේදය මගින් ප්‍රදානය කර ඇති ආදායම් බද්දෙන් නිදහස් කිරීම, 2009 පෙබරවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද තැන්පතු මුදලට අදාළවන ලාභ සහ ආදායමේ කොටසට මුදල්වලින් සංයුක්ත වන ලාභ සහ ආදායමට පමණක් අදාළ විය යුතු ය.".

6. 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තේ නිෂ්පාදනය සඳහා වූ ව්‍යවසායක් හැර වෙළෙඳපල සඳහා" සහ "ඇසිරීම සඳහා වූ ව්‍යවසායක් ", යන වචන වෙනුවට පිළිවෙලින් "වෙළෙඳපල සඳහා" යන වචන සහ "ඇසිරීම සඳහා වූ ව්‍යවසායක්; හෝ", යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(3) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ නිශ්චිතව සඳහන් නිෂ්පාදිතයක් හැර), යම් කෘෂිකාර්මික නිෂ්පාදන, උද්‍යාන හෝ කිරි නිෂ්පාදන කිරීමේ කාර්යය සහ එම නිෂ්පාදන ප්‍රයෝජනයට ගනිමින් යම් නිෂ්පාදිතයක් නිපදවීමට ගැනීම සංයුක්ත වන ව්‍යවසායකට අදාළව, එම නිෂ්පාදිතය නිපදවීම සඳහා එම නිෂ්පාදනය විවෘත වෙළෙඳපලේ පවතින මිලට විකුණනු ලැබ ඇති බවට සැලකිය යුතු අතර, එම උද්දේශිත විකිණීම මත ලාභ සහ ආදායම ගණනය කර, (1) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම එම ව්‍යවසායට අදාළ විය යුතු ය.".

7. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (4) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ඇ) ඡේදයේ "(තොග වශයෙන් වූ කළු තේ,", යන වචන වෙනුවට "එක් එක් පැකට්ටුව හෝ පාර්සලය කිලෝග්‍රෑම් එකකට වඩා වැඩි නොවන බරකින් යුක්ත වූ ද, පැකට් හෝ පාර්සල් ආකාරයෙන් නොවන්නා වූ කළු තේ," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ඇ) ඡේදයේ "(තොග වශයෙන් වූ කළු තේ" යන වචන වෙනුවට "එක් එක් පැකට්ටුව හෝ පාර්සලය කිලෝග්‍රෑම් එකකට වඩා වැඩි නොවන බරකින් යුක්ත වූ ද, පැකට් හෝ පාර්සල් ආකාරයෙන් නොවන්නා වූ කළු තේ," යන වචන ආදේශ කිරීමෙන්.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "වසර පහක්", යන වචන වෙනුවට "වසර හතක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "වසර පහක කාලය", යන වචන වෙනුවට "වසර හතක කාලය" යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තවදුරටත් මේ ඡේදයේ කිසිවක්-,, යන වචන වෙනුවට "තවදුරටත් (අ) හෝ (ආ) ඡේදවල සඳහන් කිසිවක්,, යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. 2008 අංක 9 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (ix) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අතුරු විධානය එකතු කිරීමෙන්:—

"එසේම තවදුරටත් මේ ඡේදයේ (v) වන අනුඡේදයේ සඳහන් අරමුදල 1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මගින් පිහිටුවන ලද, ජනාධිපති අරමුදල වන අවස්ථාවක දී සහ යම් රාජ්‍ය සංස්ථාවක් පිහිටුවනු ලැබුවේ යම් පනතක් මගින් හෝ එවැනි පනතක් යටතේ ද, එම පනත මගින් එම රාජ්‍ය සංස්ථාවේ යම් ලාභ ජනාධිපති අරමුදලට යැවිය යුතු බවට නියම කර ඇති අවස්ථාවක, එසේ යවනු ලබන ලාභ මෙම ඡේදයේ කාර්යය සඳහා එම අරමුදලට කරන ලද පරිත්‍යාග ලෙස සලකනු ලැබිය යුතු ය;";

(2) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ "පඩිනඩිවලින් කොටසක් නොවන්නේ නම්", යන වචන වෙනුවට "පඩිනඩිවලින් කොටසකින් නොවන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ (xi) වන අනුඡේදයට ඉකිබිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:—

"(xii) 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය;".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:"

"ගුවන් නියමුවකුගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණ.

40 අ. 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට (365 වන අධිකාරිය වූ) ගුවන් සංතරණ පනත යටතේ බලපත්‍රලත් ගුවන් ප්‍රවාහන සමාගමක (මෙහි මින් මතු මේ වගන්තියේ "අදාළ ලාභය" වශයෙන් සඳහන් කරනු ලබන) ගුවන් නියමුවකු වශයෙන් සේවය කිරීමෙන් ලැබෙන ලාභය ඇතුළත් වන විටක දී සහ (මෙහි මින් මතු මේ වගන්තියේ "බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) එම බදු අය කළ හැකි ආදායමේ කොටසක් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය සියයට විස්සක් ඉක්මවන අවස්ථාවක දී, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද, පහත දැක්වෙන ආකාරයට ගණනය කළ යුතු ය:—

(අ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස, අදාළ ලාභයට වඩා වැඩි වන අවස්ථාවක—

(i) අදාළ ලාභ මුදල හා සමාන බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද, සියයට විස්සක අනුප්‍රමාණයකට ගණනය කරනු ලැබිය යුතු ය; සහ

(ii) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ඉතිරි කොටස මත ගෙවිය යුතු බද්ද, මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ ඊට අදාළ වන්නා වූ, සියයට විස්සට වඩා වැඩි අනුප්‍රමාණයකට අනුව ගණනය කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස අදාළ ලාභයට වඩා වැඩි නොවන අවස්ථාවක, බදු අය කළ හැකි ආදායමේ අදාළ සම්පූර්ණ කොටස මත ගෙවිය යුතු බද්ද, සියයට විස්සක අනුප්‍රමාණයට ගණනය කරනු ලැබිය යුතු ය.".

12\. ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 40ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ සුදුසුකම්ලත් ලාභ මත බදු අනුප්‍රමාණ .

40 ආ.(1) 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සුදුසුකම්ලත් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට, (මෙහි මින් මතු මේ වගන්තියේ "සුදුසුකම්ලත් ලාභ" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් සුදුසුකම්ලත් තැනැත්තකු යටතේ සේවය කිරීමෙන් විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැබෙන ලාභයක් ඇතුළත් වන විටක දී සහ (මෙහි මින් මතු මේ වගන්තියේ "බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) එම බදු අය කළ හැකි ආදායමේ කොටසක් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය සියයට විස්සක් ඉක්මවන අවස්ථාවක දී, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබිය යුතු ය:—

(අ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස, එම සුදුසුකම්ලත් ලාභයට වඩා වැඩි වන අවස්ථාවක—

(i) සුදුසුකම්ලත් ලාභ මුදලට සමාන බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද, සියයට විස්සක අනුප්‍රමාණයට ගණන් බලනු ලැබිය යුතු ය ; සහ

(ii) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ඉතිරි කොටස මත ගෙවිය යුතු බද්ද, මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ ඊට අදාළ වන්නා වූ, සියයට විස්සකට වඩා වැඩි අනුප්‍රමාණයකට අනුව ගණනය කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස සුදුසුකම්ලත් ලාභ මුදලට වඩා වැඩි නොවන අවස්ථාවක, බදු අය කළ හැකි ආදායමේ සුදුසුකම් ලැබූ සම්පූර්ණ කොටස මත ගෙවිය යුතු බද්ද, සියයට විස්සක අනුප්‍රමාණයට ගණනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සුදුසුකම් ලැබූ තැනැත්තකු විසින් සේවයේ නියුක්ත කරන ලද සියලු සුදුසුකම් ලැබූ පුද්ගලයන්ට යම් තක්සේරු වර්ෂයක් තුළ දී ගෙවන ලද සුදුසුකම් ලැබූ ලාභවල මුළු එකතුව, 13 වන වගන්තියේ (ඇඇඇ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එම සුදුසුකම් ලැබූ තැනැත්තා ගිවිසුමකට එළඹ නොසිටියේ නම්, එම 13 වන වගන්තියේ (ඇඇඇ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කළ හැකිව තිබූ ලාභ සහ ආදායමට අදාළව, සුදුසුකම් ලැබූ තැනැත්තාගේ විදේශීය මුදල්වලින් වූ මුළු ඉපැයීම්වලට වඩා වැඩි නොවන බවට සහ ඒවා එම තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂයේ දී එම සුදුසුකම් ලැබූ තැනැත්තා විසින් උපයන ලද බවට එම සුදුසුකම් ලැබූ තැනැත්තා විසින් සහතික කරනු ලබන්නේ නම් මිස, (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා—

(අ) "සුදුසුකම් ලැබූ පුද්ගලයකු" යන්නෙන් සුදුසුකම්ලත් තැනැත්තකුගේ සේවයේ සේවා නියුක්තිකයකුව සිටින සහ එසේ සේවාව ඉටු කිරීමේ දී 13 වන වගන්තියේ (ඇඇඇ) ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති යම් වෘත්තියක් හෝ රක්ෂාවක් මගින් සපයනු ලබන්නා වූ සේවාවක් ඉටු කරනු ලබන යම් පුද්ගලයෙක් අදහස් වේ; සහ

(ආ) "සුදුසුකම් ලැබූ තැනැත්තා" යන්නෙන් යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සම්පූර්ණ ලාභ හෝ ආදායම, නැතහොත් එම ලාභ සහ ආදායමේ කොටසක් 13 වන වගන්තියේ (ඇඇඇ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ගිවිසුමකට ඇතුළත් නොවී සිටියේ නම්, එම ඡේදය යටතේ තම ලාභ සහ ආදායම සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් නිදහස් කරනු ලැබිය හැකි වූ යම් තැනැත්තෙක් හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ , සේවාව වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම සම්බන්ධයෙන්, ,, යන වචන වෙනුවට ,සේවාව වෙනුවෙන් 2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද ලාභ සහ ආදායම සම්බන්ධයෙන්,, යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ "සම්ප්‍රදායික නොවන භාණ්ඩ" යන්නෙන් තොග වශයෙන් වූ කළු තේ, ක්‍රේප් රබර්, යන වචන වෙනුවට "සම්ප්‍රදායික නොවන භාණ්ඩ" යන්නෙන් එක් එක් පැකට්ටුව හෝ පාර්සලය කිලෝග්‍රෑම් එකකට වඩා වැඩි නොවන බරකින් යුක්ත වූ ද, පැකට් හෝ පාර්සල් ආකාරයෙන් නොවන්නා වූ කළු තේ, ක්‍රේප් රබර්, යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

15. 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "2004 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවනු ලබන ආර්ථික සේවා ගාස්තුවලට එරෙහිව", යන වචන හා ඉලක්කම් වෙනුවට "2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යටතේ ගෙවනු ලබන ආර්ථික සේවා ගාස්තුවලට එරෙහිව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) ''සැප්තැම්බර් මාසයේ තිස්වන දින'' යන වචන වෙනුවට ''නොවැම්බර් මාසයේ තිස්වන දින'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ අතුරු විධානයේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

(අ) මේ පනතේ 4 වන වගන්තියේ සඳහන් බදු පැනවිය හැකි සේවා නියුක්ති ආදායම—

(i) එම තක්සේරු වර්ෂය 2009 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක දී, රුපියල් හාරලක්ෂ විසිදහසක් නොඉක්මවනු ලබන්නා වූ ; හෝ

(ii) එම තක්සේරු වර්ෂය 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක දී රුපියල් දස ලක්ෂයක් නොඉක්මවනු ලබන්නා වූ,

සහ එම දළ ලාභය හා ආදායමෙන් සේවා යෝජක විසින් XIV වන පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩු කර ඇත්තා වූ පුද්ගලයකුට;"; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර'' යන වචන වෙනුවට ''නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර'' යන වචන ආදේශ කිරීමෙන්.

17. 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (3) වන උප වගන්තියේ ''සැප්තැම්බර් මාසයේ තිස්වන දින'' යන වචන වෙනුවට ''ඔක්තෝබර් මස තිස් වන දින යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ ''තැනැත්තා'' යන වචනය යොදා ඇති සෑම තැනකම, ඒ වෙනුවට ''පුද්ගලයා'' යන වචනය ආදේශ කිරීමෙන්.

**18.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ii) වන අනුඡේදයේ "රුපියල් 600,000 ක් නොඉක්මවන බවට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "රුපියල් 1,000,000 ක් නොඉක්මවන බවට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (iii) වන අනුඡේදයේ "රුපියල් 600,000 ක් ඉක්මවන බවට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "රුපියල් 10,00,000 ක් ඉක්මවන බවට, යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**19.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "නිශ්චිත ගාස්තුව" යන අර්ථ නිරූපණයේ "(i) එම තක්සේරු වර්ෂයේ කිසියම් මසකට රුපියල් පනස් දහසකට,ල යන වචන වෙනුවට "(i) එම තක්සේරු වර්ෂයේ කිසියම් ලිත් මාසයක් සඳහා රුපියල් පනස් දහසකට, යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උප වගන්තියෙහි "සැප්තැම්බර්" යන වචනය එම උපවගන්තියෙහි යොදා ඇති සෑම තැනකම, ඒ වෙනුවට "නොවැම්බර්" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියෙහි :—

(අ) (අ) ඡේදයෙහි "සැප්තැම්බර් මස තිස් වන දින" යන වචන සහ "මාස දහ අටක් ඉකුත්වීමෙන් පසුව;" යන වචන වෙනුවට, පිළිවෙලින් "නොවැම්බර් මස තිස්වන දින" යන වචන සහ "වසර දෙකක කාල පරිච්ඡේදයක් ඉකුත් වීමෙන් පසුව;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ආ) ඡේදයෙහි "වසර තුනක්" යන වචන වෙනුවට "වසර හතරක්" යන වචන ආදේශ කිරීමෙන්.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 173 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ,113 වන වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ,, යන වචන සහ ඉලක්කම් වෙනුවට ,113 වන වගන්තියේ (3) වන උපවගන්තියේ, යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**22.** 2007 අංක 10 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 200 වන වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(8) යම් තැනැත්තකුගේ සම්පූර්ණ ආදායම හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් ඔහු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩු කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් ගෙවන ලද ආදායම් බද්ද, එම තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමට ඇතුළත් කර නොමැති නම්, මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන කිසිවක් එම ආදායම් බද්ද සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය."

**23.** 2008 අංක 9 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) "කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

"කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන්න විශ්‍රාම වැටුප්, අර්ථසාධක, පාරිතෝෂික හෝ ඉතිරි කිරීම් අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ අරමුදල් සම්බන්ධයෙන් දායකයන්ගේ පොළිය ආරක්ෂා කිරීම සහ ආදායම ආරක්ෂා කිරීම කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූල වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද බව අදහස් වේ. ; සහ

(2) ''තක්සේරුකරු'' යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

"ආශ්‍රිත සමාගම" යන්නෙන් ආයෝජන සමාගමකට වැදගත් බලපෑමක් ඇත්තා වූ ද, එම ආයෝජන සමාගමේ පාලිත සමාගමක් නොවන්නා වූ ද, නැතහොත් ආයෝජන සමාගම කොටස්කරුවකු වන ඒකාබද්ධ ව්‍යවසායක් නොවන්නා වූ ද, සමාගමක් අදහස් වේ.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ I වන කොටසේ " (II) වන කොටසේ හෝ (III) වන කොටසේ සඳහන් කළ පුද්ගලයන් හැර අනෙක් පුද්ගලයන්-", යන වචන හා ඉලක්කම් වෙනුවට "2009 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (II) වන කොටසේ හෝ (III) වන කොටසේ සඳහන් කළ පුද්ගලයන් හැර අනෙක් පුද්ගලයන්'' යන වචන ආදේශ කිරීමෙන්;සහ

(2) එම උපලේඛනයේ I වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කිරීමෙන්:—

**''I අ කොටස**

2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා II වන කොටසේ හෝ III වන කොටසේ සඳහන් පුද්ගලයන් නොවන වෙනත් පුද්ගලයන්—

| | |
|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 400,000 | සියයට 05 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළග රු. 400,000 | සියයට 10 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළග රු. 400,000 | සියයට 15 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළග රු. 5,00,000 | සියයට 20 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළග රු. 500,000 | සියයට 25 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළග රු. 500,000 | සියයට 30 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරිය | සියයට 35''. |

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ ''අ කොටසෙහි'' 1 වන අයිතමයේ "යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක් -", යන වචන වෙනුවට "යම් ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමක් -" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපලේඛනයේ "ආ කොටසෙහි" 2 වන අයිතමයේ "ආදායම රු. 50,000,000 ඉක්මවන" යන වචන හා ඉලක්කම් වෙනුවට "රු. 5000,000 ඉක්මවන හෝ එම සමාගම සමූහ සමාගමක පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන්.

**26.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**27.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයට, 78 වන වගන්තියේ (3) වන උපවගන්තියට, සහ 113 වන වගන්තියේ (4) වන උපවගන්තියට, 153 වන වගන්තියේ (2) වන උපවගන්තියට සහ 173 වන වගන්තියේ (2) වන උපවගන්තියට, අනුපිළිවෙළින් මේ පනතේ 10 (2) වගන්තියෙන්, 15 වන වගන්තියෙන්, 17 වන වගන්තියෙන්, 19 වන වගන්තියෙන් සහ 21 වන වගන්තියෙන් කරන ලද සංශෝධන සියලු කාර්යයන් සඳහා 2006 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට මේ පනතේ 25 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්යයන් සඳහා 2007 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට, 40අ වගන්තියට සහ 57 වන වගන්තියට, අනුපිළිවෙලින් මේ පනතේ 3(1) සහ (2) වගන්තියෙන්, 11 වන වගන්තියෙන් සහ 13 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්යයන් සඳහා 2008 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතුය.

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට මේ පනතේ 5 (2) වගන්තියෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්යයන් සඳහා 2008 ඔක්තෝබර් මස 21 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(5) ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට මේ පනතේ 5(4) වගන්තියෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්යයන් සඳහා 2009 පෙබරවාරි මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(6) මෙම වගන්තියේ (1) වන, (2) වන, (3) වන (4) වන සහ (5) වන උපවගන්තිවල නිශ්චිතව සඳහන් කර ඇති සංශෝධන හැර, ප්‍රධාන ප්‍රඥප්තියට මෙම පනතින් කරන ලද අනිකුත් සියලුම සංශෝධන, 2009 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය.

## 2009 අංක 32 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ —

1. මේ පනත 2009 අංක 32 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තියේ ''සියයට එකක් ලෙස ගණන් බලනු ලබන'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''(අ) 2009 අප්‍රේල් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට එකක අනුප්‍රමාණයකට; සහ

(ආ) 2009 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාල සීමාව සඳහා සියයට තුනක අනුප්‍රමාණයකට,

ගණන් බලනු ලබන''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''(ඈ) මේ පනත යටතේ යම් අදාළ කාර්තුවක් සඳහා වාර්තාව ඉදිරිපත් කිරීමේ දිනය එකී අදාළ කාර්තුව අවසන් වීමෙන් ඉක්බිතිව ම ආරම්භ වන මාසයේ විසි වන දිනය හෝ ඊට පෙර දිනයක් හෝ විය යුතු ය.''.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි I වන කොටසේ—

(අ) (iii) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(iii) මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් යම් අපනයනකරුවකුට විකුණන ලද—

(i) යම් ද්‍රව්‍යයක් ; හෝ

(ii) එම ද්‍රව්‍ය කොටසක් වන සේ නිෂ්පාදිත වෙනත් යම් ද්‍රව්‍යයක්,

ඇත්ත වශයෙන් ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ බවට යම් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීම මත කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන්නේ නම් එම ද්‍රව්‍ය;";

(ආ) (xiv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:—

"(xv) රටට සිදුවන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන අදාළ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, රජය විසින් එම ව්‍යාපෘතියේ බදු ගෙවීම දරන අවස්ථාවක දී එම ව්‍යාපෘතියේ භාවිත කිරීම සඳහා වූ යම් ද්‍රව්‍යයක්.";

(2) එහි II වන කොටසේ (xxii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:—

"(xxiii) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සාමාන්‍ය අලෙවි නියෝජිතයකුගේ සේවා.".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 47 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 22 වන දින]

**1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2009 අංක 47 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය"යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනු ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ii) කොමිෂන් සභාවේ බහු ක්‍රියාකාරි අංශ පිළිබිඹු කිරීම සඳහා නීතිය, මූල්‍ය, බැංකුකරණය හෝ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල වෘත්තීය ප්‍රවීනත්වය, පෘථුල පළපුරුද්ද සහ ඔප්පුකරන ලද දක්ෂතාවය සහිත පෞද්ගලික අංශයෙන් අන්තර්ග්‍රහනය කරගත් වෙනත් තැනැත්තන් හය දෙනකු;"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුලත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) ලැයිස්තුගත පොදු සමාගම් සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන කලින් කල නිකුත් කිරීම."

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ "සුරැකුම්පත්" යන අර්ථකථනය සඳහා පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

"සුරැකුම්පත්" යන්නෙන්, යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් මණ්ඩලයක් විසින් හෝ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට යෝජිත, යම් අයිතිවාසිකමක්, වර්ණයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුව ද) එහි හෝ ඒ පිළිබඳ සම්බන්ධතාවයක් ද ඇතුළුව, ණයකර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, පාදක කොටගත් විශ්වාසය රඳවා ගනු ලැබූ වත්කම්වල ස්වභාවය කුමක් වුව ද අනාගතකරණයන් සහ වර්ණයන් ද ඇතුළුව ව්‍යුත්පන්න හෝ නෝට්ටු හෝ සුරැකුම්පත් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන වෙනත් යම් සාධන පත්‍රයක් අදහස් වන අතර, විනිමය බිල් පත්‍රයක් හෝ බැංකුවක් විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුවක් හෝ තැන්පතු සහතිකයක් ඊට ඇතුළත් නොවේ;".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 25 වන දින]

**චංචල දේපළ සම්බන්ධයෙන් වගකීම් සුරක්ෂිත කිරීම, සුරක්ෂිතලත් ගනුදෙනු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාම සහ ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### නීතිය අදාළ වීම

2. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද"

(අ) යම් චංචල දේපළක් ඔඩපනය කරන හෝ එවැනි දේපළක් මිල දී ගැනීමේ ගිවිසුමකට, කොන්දේසි සහිත පැවරුමකට, මූල්‍ය කල්බදු ගිවිසුමකට ඇතුළත් වන හෝ උකස් කරන, භාණ්ඩ තොග පිළිබඳ ගෙවීම් සම්බන්ධයෙන් වූ ගිණුම් හෝ වෙනත් අයිතිවාසිකම් පැවරුමකට ඇතුළත් වනත හෝ

(ආ) ගිණුම් සහ පුද්ගලික දේපළ පත්‍ර විකිණීමේ ගිවිසුමකට ඇතුළත් වනත හෝ

(ඇ) අවුරුදු එකක් ඉක්මවනු ලබන කාල සීමාවක් සඳහා බදු ගිවිසුමකට ඇතුළත් වනත හෝ

(ඈ) 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනතේ 2 වන වගන්තිය ප්‍රකාර යම් පොරොන්දුවක් දෙනු ලබනත හෝ

(ඉ) (86 වන අධිකාරය වන) භාර ලදුපත් ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ තොග සම්බන්ධයෙන් පොරොන්දුවක් දෙනු ලබන,

යම් තැනැත්තකු විසින් (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) අයිතමවල නිශ්චිතව දක්වා ඇති එම ඔඩපනය, උකස හෝ වගකීම මෙම පනතේ විධිවිධානවලට අනුකූලව, සමපාර්ශ්වීය ද්‍රව්‍ය මගින් සුරක්ෂිත කරනු ලැබිය හැකිය:

එසේ වුව ද, මෙම පනතේ විධිවිධාන අදාළ වීම සමපාර්ශ්වීය ද්‍රව්‍යවල හිමිකම මත රඳා නොපැවතිය යුතු ය:

එසේ ම තවදුරටත් එවැනි වගකීමක කාල සීමාව අවුරුදු එකක් ඉක්මවන කාල සීමාවක් සඳහා දීර්ඝ විය යුතු ය.

3. පහත සඳහන් ගනුදෙනු මේ පනතේ විධිවිධාන අදාළ වීමෙන් මුක්තිය ලැබිය යුතු ය:—

(අ) සේවානියුක්තිකයකුගේ වන්දි සඳහා වන ඉල්ලීමක් පැවරීම;

(ආ) ව්‍යාපාරයක කොටසක් විකිණීම තුළින් පැන නගින, ගිණුම් හෝ පුද්ගලික දේපළ පත්‍ර විකිණීම;

(ඈ) එකතු කිරීමේ කාර්යය සඳහා පමණක් උපකාරී වන ගිණුම් හෝ පුද්ගලික දේපළ පත්‍ර පාවාදීම;

(ඈ) ගිවිසුමක් යටතේ වන, පැවැරුම්ලාභියකු වෙත ගෙවීමේ අයිතිය පාවාදීමේ වගකීමක්; සහ

(ඉ) පිළිවෙළින් 2009 අංක 8 දරන මෝටර් වාහන පනත, 1979 අංක 52 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත, 1971 අංක 52 දරන වෙළෙඳ නාවික පනත, සහ 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ භාණ්ඩ ලියාපදිංචි කර ඇති විටක, උපකරණ හෝ පාරිභෝගික භාණ්ඩ වශයෙන් ණයකරු සතුව පවත්නා භාණ්ඩවල යම් බැඳියාවක් පැවරීම.

4. මෙම පනතෙහි අරමුණ වනුයේ 2 වන හා 3 වන වගන්ති වලින් හඳුනාගනු ලැබූ සමපාර්ශ්වීය ද්‍රව්‍ය මෙහි නිශ්චිතව දක්වා ඇති ආකාරයට ප්‍රයෝජනයට ගැනීම තුළින් මෙම පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ඔඩපනයක්, උකසක් හෝ වගකීමක් සුරක්ෂිත කිරීම මගින් මෙම පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූලව ජාතික ආර්ථිකයේ සුභ සිද්ධිය හා ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම වන්නේ ය.

5. යම් උකස්කරුවකු, ඔඩපනහිමියකු, කොන්දේසි සහිත පැවරුම්කරුවකු, බදුදීමනාකරුවකු හෝ පැවරුම්කරුවකු විසින් එවැනි යම් උකස්කරයක්, ඔඩපනයක්, කොන්දේසි සහිත පැවරුමක්, මූල්‍ය බදු පැවරුමක් හෝ පැවරුමක් සුරක්ෂිත කිරීම සඳහා සමපාර්ශ්වීය ද්‍රව්‍ය භාරගත හැකි වන්නේ ය.

එසේ වුව ද, ණයකරුට අයත් පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමේ මුදල් සඳහා වන සුරකු බැඳියාවක් හැර වෙනත් යම් සුරකු බැඳියාවක් එවැනි යම් තැනැත්තකු විසින් භාර නොගත යුතු ය:—

එසේ ම තවදුරටත්, එවැනි සුරකු බැඳියාවක් ප්‍රයෝජනයට ගැනීම, විකිණීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සඳහා ණයකරු විසින් භුක්ති විඳිනු ලබන අයිතිවාසිකම් හේතුවෙන් එවැනි යම් සුරකු බැඳියාවක් අවලංගු වන බවට සලකනු නොලැබිය යුතු ය.

6. යම් වගකීමක් සුරක්ෂිත කිරීම සඳහා ණයකරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන සමපාර්ශ්වික ද්‍රව්‍ය පිළිබඳ යම් බැඳියාවක් එක් වගකීමකට වඩා වැඩි සංඛ්‍යාවක් සුරක්ෂිත කිරීම සඳහා යෙදවිය හැකි ය.

## II වන කොටස

## සුරක්ෂිතලත් ගනුදෙනු

7. (1) 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය මගින් මේ පනතේ කාර්යය සඳහා (මෙහි මින් මතු "ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන) සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනයක් පවත්වාගෙන යා යුත්තේ ය. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනතේ නිශ්චිතව සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අමතරව පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය එකී කාර්යාංශයට ඇත්තේ ය:—

(අ) සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය පවත්වාගෙන යාම සහ චංචල දේපළවල සුරකු බැඳියාව එකී ලේඛනයේ ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය නියමිත ආකාරයට පවත්වාගෙන යාම;

(ආ) 2 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) අයිතමවල නිශ්චිතව දක්වා ඇති යම් තැනැත්තකු විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍ය සඳහා වන සුරකු බැඳියාව පිළිබඳව ගොනුකර ඇති දැන්වීම ලියාපදිංචි කිරීම;

(ඇ) විනිශ්චිත ණයහිමියකුගේ හිමිකම් පිළිබඳ දැන්වීම ලියාපදිංචි කිරීම; සහ

(ඈ) සියලු, කල් ඉකුත් වූ දැන්වීම්වල එම කල් ඉකුත් වූ දින සිට වර්ෂ දහයක කාල සීමාවක් සඳහා වාර්තාවන් පවත්වාගෙන යාම.

(2) චංචල දේපළවල සුරකු බැඳියාව ලියාපදිංචි කිරීමට අදාළවන බලතල, කාර්ය සහ කර්තව්‍ය 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධාන යටතේ එකී කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන් විසින් ඉටුකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, චංචල දේපළවල සුරකු බැඳියාව ලියාපදිංචි කිරීමට අදාළවන බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී, එම නිලධරයන් සහ සේවකයන්, මේ පනත යටතේ විධිවිධාන සලසා ඇති පරිදි කලින් කල සාදනු ලබන නියෝග සහ රීතිවලට යටත් විය යුතු ය.

**8.** (1) ගොනුකරනු ලබන සෑම දැන්වීමක්ම ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින්, 7 වන වගන්තිය ප්‍රකාර පවත්වාගෙන යනු ලබන ලේඛනයේ ඇතුළත් කල යුතු අතර, එකී ලේඛනයෙන් —

(i) එම දැන්වීම මූලික දැන්වීමක් වන සියලු අවස්ථාවල දී එයට අනන්‍ය ලිපිගොනු අංකයක් ලබාදිය යුතු ය;

(ii) මූලික දැන්වීම නොවන්නා වූ අනෙකුත් සෑම දැන්වීමකට ම අංකයක් ලබාදිය යුතු ය;

(iii) ගොනුකර ඇති වාර්තා සඳහා ලබාදුන් අංක සහ ඒවා ගොනු කරන ලද දිනය සහ වේලාව දරන වාර්තාවක් සකස් කළ යුතු ය; සහ

(iv) මහජනතාව විසින් පරීක්ෂා කිරීම සඳහා එකී කාර්යාංශයේ ගොනුකර ඇති වාර්තා පවත්වාගෙන යා යුතු ය.

(2) ලේඛනයේ එක් එක් මූලික දැන්වීමක් පිළිබඳව වූ සුචි පත්‍රයක් ණයකරුගේ නමින් ඇතුළත් විය යුතු අතර, මූලික දැන්වීමක් හා සම්බන්ධ ගොනුකර ඇති සියලු වාර්තාවන් මූලික දැන්වීම හා ආශ්‍රිත වන ආකාරයට සුචිගත කළ යුතු ය.

(3) ණයකරුගේ නම සහ වාර්තාව අදාළ වන මූලික දැන්වීම සඳහා ලබාදී ඇති ගොනු අංකය ද, අනිකුත් අදාළ වාර්තා ද මගින් වාර්තාව සොයා ගතහැකිවන අයුරින් ලේඛනය පවත්වාගෙන යා යුතු ය.

(4) කල් ඉකුත් වූ දැන්වීම්වල වාර්තා එසේ කල් ඉකුත් වූ දිනයෙන් ඔබ්බට වූ වර්ෂ දහයක කාල සීමාවක් තුළ ලේඛනයේ ඇතුළත් විය යුතු ය.

(5) දැන්වීමක් ලියාපදිංචි කිරීම සඳහා භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම, එම දැන්වීමේ ඇතුළත් යම් තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වාසනීයභාවය හෝ වලංගුභාවය සම්බන්ධයෙන් බලපෑමක් ඇති නොකළ යුතු ය.

**9.** (1) පහත සඳහන් තොරතුරු ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත ඉල්ලුම් කරන යම් තැනැත්තකු වෙත ණය තොරතුරු කාර්යාංශය විසින් පහත සඳහන් තොරතුරු ලබාදිය හැකි ය:—

(i) සුරක්ෂිතලත් පාර්ශ්වයක් සම්බන්ධයෙන් සමපාර්ශ්වීය ද්‍රව්‍ය මගින් සුරක්ෂිත කරනු ලැබූ ණයක් පැවතීම පිළිබඳ තොරතුරු සහ දෙනු ලබන දිනයක දී සහ වේලාවක දී එවැනි ණයකරුවකු සහ සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ විස්තර;

(ii) ගොනු අංකය පිළිබඳ තොරතුරු සහ ඉල්ලීම අදාළ වන දැන්වීම ගොනුකරන ලද දිනය සහ වේලාව;

(iii) ඉල්ලීම අදාළ වන එක් එක් දැන්වීමෙහි ඇතුළත් තොරතුරු.

(2) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ කාර්යාලය වෙත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී, ඉල්ලුම්කරු විසින් ණයකරු හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු ලබා දිය යුතු ය:"

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හා ස්වභාවික පුද්ගලයකු වන ණයකරුගේ ජාතික හැඳුනුම් පතෙහි අංකය සහ ණයකරු සංස්ථාගත මණ්ඩලයක් වන විට, එයට අදාළ වන ලියාපදිංචි අංකය;

(ii) එම ණයකරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු සහ පුද්ගල මණ්ඩලයක් වන විට ණයකරුගේ නම;

(iii) ලබාගත හැකි අවස්ථාවක දී දැන්වීමේ ගොනු අංකයත සහ

(iv) එවැනි තොරතුරු අවශ්‍ය වනු ලබන හේතුව.

(3) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් ඕනෑම භාෂාවකින් තොරතුරු සන්නිවේදනය කළ හැකි ය:

එසේ වුව ද, ඉල්ලීමක් කරනු ලැබූ විට, ණය තොරතුරු කාර්යාංශය විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියේ වූ ඉල්ලන ලද තොරතුරු පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක් එකී කාර්යාංශය විසින් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම සහතිකය සාක්ෂි දීමේ දී ආවේශ්‍ය විය යුතු අතර, එය එහි සඳහන් කොට ඇති කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

**10.** (1) ලේඛනයේ ඇතුළත් කොට ඇති සෑම ලියවිල්ලක්ම පොදු ලියවිල්ලක් ලෙස සැලකිය යුතු ය.

(2) සුරක්ෂිතලත් ගනුදෙනුවකට අදාළ යම් සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටින යම් තැනැත්තකු හට නියමිත ගාස්තුවක් ගෙවීම මත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත ගොනුකර ඇති යම් ලියවිලිවල පිටපත් ලබාගැනීමට සහ ඒවා පරීක්ෂා කිරීමට අයිතිය තිබිය යුතු ය.

**11.** (1) සෑම මූලික දැන්වීමක ම -

(i) ණයකරුගේ ජාතික හැඳුනුම් පතෙහි අංකය සහ ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනය සමග ණයකරුගේ නම සහ සංස්ථාගත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට එයට අදාළ ලියාපදිංචි අංකය;

(ii) සුරක්ෂිතලත් පාර්ශ්වයේ හෝ සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ලිඛිතව බලය පවරනු ලැබූ නියෝජිතයාගේ ජාතික හැඳුනුම් පතෙහි අංකය සහ සංස්ථාගත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට එයට අදාළ ලියාපදිංචි අංකය ද, සුරක්ෂිතලත් පාර්ශ්වයේ හෝ එම අනුයෝජිතයාගේ සහ සංස්ථාගත මණ්ඩලයක් වන විට එකී මණ්ඩලයේ ද ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනය;

(iii) දැන්වීම මගින් ආවරණය කරනු ලබන සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ විස්තරයක්; සහ

(iv) මේ පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුගේ ණය ලබාදීම සඳහා වූ විශ්වාසනීයබව තක්සේරු කිරීමට අවශ්‍ය වන්නා වූ යම් වෙනත් නියමිත තොරතුරු:

එසේ වුව ද, එම සමපාර්ශ්වීය ද්‍රව්‍ය මගින් තිරවුරු සම්බන්ධයෙන් වූ අනාගත අපේක්ෂා ආවරණය කරනු ලබන්නේ නම් අදාළ චංචල දේපළ පිළිබඳ විස්තරයක් එම දැන්වීමේ ඇතුළත් විය යුතු ය.

(2) යම් වගකීමක් සමපාර්ශ්වීය ද්‍රව්‍ය මගින් සුරක්ෂිත කරනු ලබන යම් තැනැත්තකුට ණයකරු විසින් එම දැන්වීම ගොනුකිරීම සඳහා බලය පවරන ලද්දේ නම් පමණක් මූලික දැන්වීමක් ගොනුකිරීම සඳහා හිමිකම තිබිය යුතු ය. කෙසේවුව ද එවැනි බලය පැවරීමක් දැන්වීමෙහි කොටසක් නොවිය යුතු ය.

(3) මෙම පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ණයකරුවකු විසින් ඔහු විසින් එළඹුනු සුරකු ගිවිසුම, එයින් ආවරණය කරනු ලැබූ කාල සීමාව නොතකා අත්සන් කරනු ලැබීම මගින්, එකී ගිවිසුමේ සඳහන් සමපාර්ශ්වීය ද්‍රව්‍ය හා එයින් ලැබූ ලාභ ඇත්නම් එකී ලාභ ද ආවරණය කරනු ලබන මූලික දැන්වීමක් ගොනුකිරීම සඳහා බලය පැවරිය යුතු ය.

(4) සුරක්ෂිතලත් ගනුදෙනුවකට ඇතුළත් වීමට පෙර මූලික දැන්වීමක් ගොනු කළ හැකි ය.

**12.** (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, දැන්වීමක පහත සඳහන් කරුණු පැහැදිලිව දක්වා ඇතිවිට එය වලංගු සහ බලාත්මක විය යුතු ය:—

(i) ණයකරු පුද්ගලයකු වනවිට එම තැනැත්තාගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය;

(ii) ණයකරු ස්වභාවික පුද්ගලයකු වනවිට සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන විට සහ එම තැනැත්තාගේ ගුවන් ගමන් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට එම තැනැත්තාගේ නම සහ ගුවන් ගමන් බලපත්‍රය නිකුත් කරන ලද ස්ථානය;

(iii) ණයකරු ස්වභාවික පුද්ගලයකු නොවන විට සහ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් නීතියක විධිවිධාන ප්‍රකාරව පුද්ගලයකු වශයෙන් අන්‍යාකාරයෙන් හඳුනාගනු ලැබූ තැනැත්තකු වනවිට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් නීතියක් යටතේ හඳුනාගනු ලැබූ ආකාරයට ණයකරුගේ නම;

(iv) ණයකරු, සමාගම් පනත යටතේ ව්‍යාපාර කටයුතු කිරීම සඳහා සුදුසුකම් ලැබූ ස්වභාවික පුද්ගලයකු නොවන විදේශිකයකු වනවිට සමාගම් රෙජිස්ට්‍රාර් විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ණයකරුගේ නම; හෝ

(v) ණයකරු මෙම වගන්තියේ ඃසඩ* වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති තැනැත්තකු නොවන අයකු වනවිට, විදේශික තැනැත්තා ලියාපදිංචි කරනු ලැබූ රටේ උචිත ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ණයකරුගේ නම.

(2) දැන්වීමක ණයකරුගේ නම නිවැරදි ලෙස සඳහන් කර ඇතිවිට" ණයකරුගේ වෙළෙඳනාමය හෝ අනෙක් නාමය සඳහන් කර නොමැතිවීම මගින් එවැනි දැන්වීමක් අවලංගු නොවිය යුතු ය:

එසේ වුව ද, එම දැන්වීම මගින් ණයකරුගේ නම නිවැරදිව නිශ්චිත ලෙස සඳහන් කිරීම පැහැර හැර ඇත්නම් එම දැන්වීම අවලංගු විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් දැන්වීමක් මගින්, ණයකරුවන් එක් අයකුට වඩා වැඩි සංඛ්‍යාවකගේ නම් සහ සුරක්ෂිතලත් පාර්ශ්වයන් එකකට වඩා වැඩි සංඛ්‍යාවකගේ නම් සඳහන් කළ හැකි ය.

(4) සුරක්ෂිතලත් පාර්ශ්වයක අනුයෝජිතයකු වශයෙන් යම් තැනැත්තකුගේ තත්ත්වය නිශ්චිතව සඳහන් කිරීමට අපොහොසත් වීම මගින් එවැනි යම් දැන්වීමක වලංගුභාවය බලරහිත නොවිය යුතු ය.

## III වන කොටස

## දැන්වීම සංශෝධනය කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අවසන් කිරීම

13. (1) යම් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වූ සුරකු බැඳියාව හෝ වගකීම බලාත්මකව පවතින අවස්ථාවේ දී බන්ධනලාභියා විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක අවශ්‍යතාවය අත්හරිනු ලැබූ විටක එකී අත්හැරීම සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වයේ දැනුම හෝ කැමැත්ත ලබා තිබුන ද, නොතිබුන ද ගොනු කොට ඇති මූලික දැන්වීම අඛණ්ඩව වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය.

(2) ණයකරුගේ නම වෙනස් කිරීම හේතුකොටගෙන ගොනු කොට ඇති දැන්වීමක් නොමග යවන සුළු වී ඇති අවස්ථාවක, ණයකරුගේ නම වෙනස් කිරීමෙන් මාස හතරක කාලයක් ඇතුළත හෝ ඊට පෙර ණයකරු විසින් අත්පත් කරගන්නා සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ සුරකු බැඳියාව පරිපූර්ණවීමේ කාර්යය සඳහා, එම දැන්වීම වලංගු හා බලාත්මක විය යුතු ය:

එසේ වුව ද, එම වෙනස සිදුකිරීමෙන් මාස හතරක කාලයක් ඇතුළත එම වෙනස් කිරීම, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අවධානයට යොමු කළහොත්, එසේ නම වෙනස් කිරීමෙන් මාස හතරක කාලයක් පසු වී ණයකරු විසින් අත්පත් කරගන්නා සුරකු බැඳියාව පරිපූර්ණවීම සඳහා එම දැන්වීම වලංගු හා බලාත්මක විය යුතු ය.

(3) අවස්ථාගත කරුණු වෙනස්වීමේ හේතුවෙන් ණයකරුගේ වැඩිමනත් තොරතුරුවල නිවැරදි විස්තරයක් දැන්වීමේ අඩංගු නොවන්නේ නම් මිස, ණයකරුගේ නම වෙනස් කිරීමෙන් අනතුරුව ද දැන්වීම වලංගුව හා බලාත්මක පවතින්නේ ය.

14. (1) අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් ගොනු කිරීම මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද්දේ නම් මිස, මෙම පනත යටතේ ගොනු කරනු ලබන සෑම දැන්වීමක්ම ගොනු කරනු ලබන දින සිට වසර පහක කාල සීමාවක් සඳහා වලංගුව පවතින්නේ ය.

(2) දැන්වීමක් ගොනු කිරීමකින් තොරව සුරකු බැඳියාව පරිපූර්ණ වන්නේ නම් මිස, දැන්වීමක වලංගුභාවය ඉකුත්වීම මත, එම දැන්වීම මගින් පරිපූර්ණ වන ඇප හිමිකම අවලංගු විය යුතු ය.

(3) එම දැන්වීමෙහි වලංගුභාවය ඉකුත්වීම මත සුරකු බැඳියාව අවලංගු වුවහොත් එහි වටිනාකම සඳහා වන සමපාර්ශ්වීය ද්‍රව්‍ය පෙර හෝ පසුව මිලදී ගන්නකුට එරෙහිව එය කිසිකලෙක පරිපූර්ණ නොවූ බවට සලකනු ලැබිය යුතු ය.

**15.** (1) මූලික දැන්වීමක් සංශෝධන එකක් හෝ කීපයක් කිරීමෙන් සංශෝධනය කරනු ලැබිය හැකි ය. එවැනි සංශෝධනයක

(i) මූලික දැන්වීමට වෙන් කර දෙනු ලැබූ අනන්‍ය ගොනු අංකයෙන් මූලික දැන්වීම හඳුන්වනු ලැබිය යුතු ය;

(ii) දැන්වීම මත සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම සහ සංශෝධනයට බලය දෙනු ලබන තැනැත්තාගේ නම නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය;

(iii) එය දැන්වීමෙහි සංශෝධනයක් බව දක්වා තිබිය යුතු ය;

(iv) දැන්වීමෙහි සංශෝධිත තත්ත්වය පිළිබිඹු වන ආකාරයෙන්, මූලික දැන්වීමෙහි තිබිය යුතු අදාළ සියලුම තොරතුරු සපයනු ලැබ තිබිය යුතු ය.

(2) සංශෝධනයක් මගින්, දැන්වීමකින් ආවරණය වන සමපාර්ශ්වීය ද්‍රව්‍යවලට හෝ ණයකරුවකුට එකතු කිරීමක් කරනු ලබන අවස්ථාවක, ණයකරු විසින් ඒ සංශෝධනය ගොනු කිරීමට ලිඛිතව බලය දෙනු ලබන්නේ නම්, ඒ සංශෝධනය බලාත්මක විය යුතු ය.

(3) දැන්වීමෙහි සුරක්ෂිතලත් පාර්ශ්වයන් එකකට වඩා නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති අවස්ථාවක, එක් සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් සංශෝධනය ගොනු කිරීම සඳහා ලිඛිතව අනුමැතිය ලබා දෙන්නේ නම්, ඒ සංශෝධනයට වලංගුභාවය ලැබිය යුතු ය.

(4) දැන්වීමට සමපාර්ශ්වීය ද්‍රව්‍ය එකතු කිරීම සඳහා කරන ලද සංශෝධනයක් වන්නේ නම්, එසේ එකතු කරන ලද සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් එකී සංශෝධනය එය ගොනු කරන ලද දිනයේ සිට පමණක් වලංගු භාවය ලැබිය යුතු ය.

(5) දැන්වීමට ණයකරුවකුගේ නමක් එකතු කිරීම සඳහා කරන ලද සංශෝධනයක් වන්නේ නම් එසේ එකතු කරන ලද ණයකරුවා සම්බන්ධයෙන් වන විට, සංශෝධනය ගොනු කරන ලද දිනයේ සිට පමණක් වලංගුභාවය ලැබිය යුතු ය.

(6) දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් සංශෝධනයක් ගොනු කිරීම සඳහා ලිඛිතව අනුමැතිය ලබා දී ඇති අවස්ථාවක, සමපාර්ශ්වීය ද්‍රව්‍ය හෝ ණයකරුවකු එකතු කිරීම සඳහා කරනු ලබන සංශෝධනයක් හැර එවැනි සංශෝධනයකට වලංගුභාවය ලැබිය යුතු ය.

(7) සංශෝධනයක් මඟින් නව සුරක්ෂිතලත් පාර්ශ්වයක් නම් නොකොට සියලුම සුරක්ෂිතලත් පාර්ශ්වයන්ගේ නම් ඉවත් කරනු ලබන අවස්ථාවක හෝ ණයකරුවකුගේ නම ඉවත් කොට, කලින් දැන්වීමේ නිශ්චිතව සඳහන් නොකරන ලද ණයකරුවකු නම් කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, සංශෝධනයක් වලංගු නොවන්නේ ය.

(8) දැන්වීමක නිශ්චිතව සඳහන් සුරක්ෂිතලත් පාර්ශ්වයන් එකකට වඩා ඇති අවස්ථාවක, සංශෝධනයක් ගොනු කිරීම සඳහා එක් එක් සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අනුමැතිය ලබා දිය යුතු ය.

(9) 11 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, දැන්වීමක වලංගු කාලසීමාව, සංශෝධනයක් ගොනු කරනු ලැබීමේ හේතුවෙන්ම දීර්ඝ කිරීම හෝ දීර්ඝ කරන ලදැයි සලකනු ලැබීම හෝ නොකළ යුතු ය.

**16.** (1) දැන්වීමක වලංගු කාල සීමාව

(i) මුල් දැන්වීම එහි අනන්‍ය ගොනු අංකයෙන් හඳුන්වනු ලබන;

(ii) අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයට අනුමැතිය ලබා දුන් සුරක්ෂිතලත් පාර්ශ්වයක් දැන්වීමේ හඳුන්වනු ලබන;

(iii) ගොනු කිරීමට අනුමැතිය දුන් සුරක්ෂිතලත් පාර්ශවය සම්බන්ධයෙන්, දැන්වීමේ වලංගුභාවය දීර්ඝ කිරීම දක්වනු ලබන,

අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් ගොනු කිරීමෙන් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) දැන්වීමේ පස් අවුරුදු කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව වූ මාස හයක කාලය තුළ, අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි අතර මෙහි නිශ්චිතව දැක්වෙන කාලසීමාව තුළ අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් ගොනු

කිරීමෙන් පසුව, දැන්වීමේ වලංගුභාවය, එම දැන්වීම අවලංගුභාවයට පත් විය හැකිව තිබූ දිනයේ සිට ආරම්භව එතැන් සිට වැඩිදුරටත් වූ පස් අවුරුදු කාල සීමාවකට අඛණ්ඩව පැවතිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි දීර්ඝ කරන ලද පස් අවුරුදු කාල සීමාව ඉකුත්වීමේ දී වලංගුභාවය ඉකුත්වීමට පෙර එම සුරක්ෂිත පාර්ශ්වය විසින් අනුමතිය දෙනු ලැබූ තවත් අඛණ්ඩතාව පිළිබඳව ප්‍රකාශයක් ගොනු කරනු ලැබ ඇත්නම් මිස, දැන්වීමේ වලංගුභාවය ඉකුත් වන්නේ ය. ඉන්පසුව, අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශය ගොනු කිරීමට අනුමතිය දෙනු ලැබූ සුරක්ෂිතලත් පාර්ශවය සම්බන්ධයෙන් පමණක් දැන්වීමක වලංගුභාවය අඛණ්ඩව පවතින්නේ ය.

(4) දැන්වීමේ වලංගුභාවය අඛණ්ඩව පැවතීම සඳහා අනුප්‍රාප්ත අඛණ්ඩතාවය පිළිබඳ ප්‍රකාශ, ඒ ආකාරයෙන් ම ගොනු කරනු ලැබිය හැකි වන්නේ ය.

17. (1) දැන්වීමක වලංගුභාවය, නියමිත ආකෘතියෙහි වූ අවසන් කිරීමේ ප්‍රකාශයක් ගොනු කිරීමෙන් අවසන් කරනු ලැබිය හැකි ය.

(2) ණයකරුවකුගෙන් ලිඛිත ඉල්ලීමක් ලැබුණවිට,

(අ) ඉටු නොකළ සුරක්ෂිතලත් බැඳීමක් නොපවතින්නේ නම්;

(ආ) අත්තිකාරම් මුදලක් ගෙවීම සඳහා පොරොන්දුවක් නොපවතින්නේ නම්; සහ

(ඇ) දැන්වීම ගොනු කිරීම සඳහා ණයකරුගෙන් ලිඛිත අනුමැතියක් ලබා ඇත්තේ නම්,

සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අවසන් කිරීමේ ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි වන්නේ ය.

18. (1) මූලික දැන්වීමක්, සංශෝධනයක්. අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් හෝ අවසන් කිරීමේ ප්‍රකාශයක්, ලියාපදිංචි කරනු ලැබූ සහ ලේඛනයේ ඇතුළත් කරනු ලැබූ දිනයේ සිට වලංගු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (i) යම් ලියවිල්ලක් මූලික දැන්වීමක් වන්නා වූ අවස්ථාවක, එහි ණයකරුගේ නම දැක්වීමට අපොහොසත් වී තිබේ නම්;

(ii) යම් ලියවිල්ලක් සංශෝධනයක් වන්නා වූ අවස්ථාවක, වාර්තාවේ ණයකරුගේ නම දැක්වීමට අපොහොසත් වී තිබේ නම්;

(iii) යම් ලියවිල්ලක් අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් වන්නා වූ අවස්ථාවක, එහි වාර්තාවේ, මුල් දැන්වීමේ ගොනු අංකය දක්වා නොමැති නම් හෝ මුල් දැන්වීමේ කාලය ඉකුත්වීමේ දිනයේ සිට මාස හයක් ගතවීමට පෙර එම ගොනු අංකය සැපයීම පැහැර හරිනු ලබන්නේ නම්;

(iv) යම් ලියවිල්ලක් අවසන් කිරීමේ ප්‍රකාශයක් වන්නා වූ අවස්ථාවක, එහි වාර්තාවේ, මුල් දැන්වීමේ ගොනු අංකය දක්වා නොමැති නම් හෝ දැන්වීමේ නිශ්චිතව නම් සඳහන් කර ඇති එක් එක් සුරක්ෂිතලත් පාර්ශ්වය සම්බන්ධයෙන් දැන්වීමේ කාලය ඉකුත් වී තිබේ නම්; සහ

(v) බන්ධනදායී විසින් නියමිත ගාස්තුව ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්නම් හෝ ගාස්තුව වාරිකව ගෙවීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොමැති නම්,

එවැනි ලේඛනයක් ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ දක්වා ඇති හේතු නොවන්නා වූ වෙනත් හේතු නිසා වාර්තාව ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ගොනුවේ වාර්තාව නොතිබීම මත යුක්තිසහගත සහ විශ්වාසනීය වටිනාකමක් ලබා දෙන්නා වූ සමපාර්ශ්වීය ද්‍රව්‍ය මිල දී ගැනීමට එරෙහිව හැර, එම වාර්තාව ගොනු කරනු ලැබූ වාර්තාවක් ලෙස වලංගු වන්නේ ය.

(4) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් ගොනු කිරීම සඳහා වාර්තාවක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින්, එම කරුණ පිළිබඳව, කාර්යාංශය විසින් කඩිනමින් එම වාර්තාව ඉදිරිපත් කළ තැනැත්තාට, දැනුම් දීමක් කළ යුතු ය.

(5) දැන්වීමක එක් සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් අවසර දෙනු ලබන දැන්වීමක් මගින් එකී දැන්වීමේ වෙනත් සුරක්ෂිතලත් පාර්ශ්වයක අයිතිවාසිකම්වලට බලපෑමක් ඇති නොවිය යුතු ය.

**19.** (1) මූලික දැන්වීමේ යම් තැනැත්තකුගේ නම නිශ්චිතව සාවද්‍ය ලෙස දක්වා තිබෙන බවට හෝ වැරදි ලෙස දක්වා තිබෙන බවට විශ්වාස කිරීමට යම් තැනැත්තකුට හේතු තිබෙන අවස්ථාවක, ඔහු විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට ඒ බව දැනුම් දීමට වහාම පියවර ගත යුතු අතර ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් කාරණා සලකා බලා, ඒ අනුව නම විශෝධනය කළ යුතු ය.

(2) විශෝධන ප්‍රකාශයක —

(අ) මුල් දැන්වීමට වෙන් කර දී ඇති ගොනු අංකයෙන් එය අදාළ වන වාර්තාව කුමක්ද යන්න හඳුන්වනු ලැබිය හැකි ය;

(ආ) එය විශෝධන ප්‍රකාශයක් බව දක්වා තිබිය හැකි ය;

(ඇ) එම ප්‍රකාශය සාවද්‍ය බව විශ්වාස කිරීමට පදනම් වූ හේතු සහ එම ප්‍රකාශය නිරවද්‍ය කළ යුතු ආකාරය දක්වා තිබිය හැකි ය; සහ

(ඈ) විකුණන ලද එහෙත්, ණයකරු හෝ බැඳීමට යටත් වෙනත් තැනැත්තකු විසින් ඒ යටතේ වූ තම වගකීම් නිදහස් කරනු ලැබූ යම් ගිණුම් හෝ පුද්ගලික දේපළ පත්‍ර දැන්වීම මගින් ආවරණය වන බව දැක්විය හැකි ය.

(3) අවසන් කිරීමේ ප්‍රකාශයකට දැන්වීම මත වූ සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් ලිඛිතව බලය ලබා දී තිබේ නම් පමණක්, එකී සුරක්ෂිතලත් පාර්ශ්වයේ අයිතිවාසිකම බලාත්මක වීම අවසන් වන්නේ ය. බලාත්මකව පවතින අවසන් කිරීමේ ප්‍රකාශයක් ගොනු කිරීමේ දී, අවසන් කිරීමේ ප්‍රකාශය අදාළ වන්නේ කවර දැන්වීමකට ද, එම දැන්වීම සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් බලය ලබා දීම සම්බන්ධයෙන් බල රහිත වන්නේ ය.

**20.** (1) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් යම් දැන්වීමක්, සංශෝධනයක්. අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් හෝ අවසන් කිරීමේ ප්‍රකාශයක් ලියාපදිංචි කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් උකසක් පැවතීම හෝ නොපැවතීම පිළිබඳව අවසානාත්මක සහ තීරණාත්මක සාක්ෂි ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමග කරනු ලබන ලියාපදිංචි කිරීමකින් සපයනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් දැන්වීමක්, සංශෝධනයක්, අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක් හෝ අවසන් කිරීමේ ප්‍රකාශයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එම කාර්යාංශය විසින්, ලියාපදිංචිවීම සඳහා අයදුම් කරන ලද තැනැත්තාට, ප්‍රතික්ෂේප කිරීමට හේතු ලිඛිතව දැනුම් දිය යුතු ය.

(4) දැන්වීමේ එක් සුරක්ෂිතලත් පාර්ශවයක් විසින් අනුමැතිය ලබා දෙන ලද හා ගොනුකරනු ලැබූ දැන්වීමක් මඟින් වෙනත් සුරක්ෂිතලත් පාර්ශ්වයකගේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවන්නේ ය.

(5) ගොනු කරන ලද දැන්වීමක වැරදි තොරතුරු අඩංගු වී ඇති බවට දැනුම් දෙන යම් තැනැත්තෙක් වහාම එම වරද නිවැරදි කරමින් ලියවිල්ලක් ගොනු කළ යුතු ය.

**21.** (1) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ගොනු කරන ලද දැන්වීමකට අදාළව, යම් තැනැත්තකුට නියමිත තොරතුරු සැපයීම, එම කාර්යාංශයේ කාර්යය විය යුතු ය.

(2) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් අවශ්‍ය තොරතුරු ඇතුළත් නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් නිකුත් කළ යුතු අතර රීතිවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට ලියවිලි පවත්වාගෙන යා යුතු ය.

## IV වන කොටස

## විවිධ විධිවිධාන

**22.** (1) මේ පනතෙ ප්‍රකාර පරිපාලනය, කළමණාකරනය සහ ලියවිලි පවත්වාගෙන යාමේ කාර්ය පටිපාටිය ද, ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් රීති සාදනු ලැබිය හැකි වන්නේ ය.

(2) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

23. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා නැතහොත් පහත දැක්වෙන කාරණා ඇතුළුව, මේ පනත මගින් නියෝග සෑදීමට නියම කර ඇති හෝ බලය ලබා දී ඇති කරණා සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(i) සලසනු ලබන සේවා සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු ප්‍රමාණය සහ 7 වන වගන්තිය ප්‍රකාර ලේඛනය පවත්වාගෙනයාමේ කර්තව්‍ය කරගෙන යා යුතු ආකාරය ද, එකී ලේඛනයේ ඇතුළත් කළ යුතු කාරණා ද ඇතුළුව ඒ ගාස්තු රැස්කරගත යුතු ආකාරය;

(ii) ඉලෙක්ට්‍රොනික වාර්තා පවත්වාගෙන යා යුතු ආකාරය ද ඇතුළුව, සෝදිසි කිරීම් මෙහෙයවිය යුතු ආකාරය;

(iii) දැන්වීම් භාරදීම සඳහා වන ආකෘති පත්‍රය සහ අවශ්‍ය තොරතුරු;

(iv) විනිශ්චිත ණය හිමියාගේ තොරතුරු සහ චංචල දේපළවල තොරතුරු, ගෙවීම් කළ යුතු තැනැත්තා හඳුනාගැනීමට අදාළ තොරතුරු හෝ විනිශ්චිත ණය හිමියා විසින් ඉටු කර ඇති කාර්යයන්, සුරකුව පිළිබඳ තොරතුරු සහ දැන්වීම.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

24 මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

25. මේ පනතේ කාර්යය සඳහා, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස —

"පැවරීම" යන්නෙන් ගිණුමකට, පුද්ගලික දේපළ පත්‍රයකට, ලියවිල්ලකට, සාධන පත්‍රයකට හෝ ගෙවීම් ලබා ගැනීමට ඇති වෙනත් අයිතියකට ඇති අයිතිවාසිකම සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ එක් තැනැත්තකුගෙන් තවත් තැනැත්තකුට පවරා දීම අදහස් වේ;

"පුද්ගලික දේපළ පත්‍රය, යන්නෙන් භාණ්ඩ මත හෝ භාණ්ඩ පිළිබඳ වූ බද්දක් මත ණයක් සහ සුරකු බැඳියාවක් ඇති කරන්නා වූ, ලේඛනයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, යන්නෙන් 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය අදහස් වේ;

"සමපාර්ශ්වීය ද්‍රව්‍ය, යන්නෙන් සුරකු බැඳියාවකට යටත් දේපළ අදහස් වන අතර එයට ඕනෑම ආකාරයක චංචල ද්‍රව්‍ය ද, සියලුම ආකාරයේ අස්පර්ෂණීය ද්‍රව්‍ය ද, ගොවි නිෂ්පාදන ද, තිරවුරු ද, කැපීමට ඇති දැව ද, කැනීමට ඇති ඛනිජ ද්‍රව්‍ය ද ඇතුළත් වේ. මෙම යෙදුමට අනාගතයේ දී ඇතිවන සමපාර්ශ්වීය ද්‍රව්‍ය ද, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත ස්ථානගත ව ඇති සමපාර්ශ්වීය ද්‍රව්‍ය ද, විකුණනු ලැබ ඇති ගිණුම් සහ පුද්ගලික දේපළ පත්‍ර ද, බදු දී ඇති භාණ්ඩ ද, ලාභ ද ඇතුළත් වේ;

"විනිශ්චිත ණය හිමියා, යන්නෙන් —

(i) අධිකරණ ආඥාවක් යටතේ හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත නොවන්නා වූ බල පවත්නා වෙනත් යම් නීතියක් මගින් ලැබුණු බලය යටතේ, සුරක්ෂිතලත් පාර්ශ්වයේ සමපාර්ශ්වීය ද්‍රව්‍ය මත අයිතිවාසිකමක් ලබාගන්නා හෝ සුරක්ෂිතලත් පාර්ශ්වයේ සමපාර්ශ්වීය ද්‍රව්‍ය තහනමට ගැනීමට අයිතිවාසිකමක් ලබාගන්නා තැනැත්තෙක්;

(ii) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඈවරකරුවකු;

(iii) (97 වන අධිකාරය වන) වස්තු භංගත්ව පනත යටතේ ලැබුම්කරුවකු;

(iv) වරණීය ණය හිමියකු,

අදහස් වේ;

"දැන්වීම" යන්නෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන ලේඛනයේ ගොනු කරන ලද හෝ ගොනු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වාර්තාවක් අදහස් වන අතර එයට, ගොනු කරන ලද හෝ ගොනු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සංශෝධන, අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශ සහ අවසන් කිරීමේ ප්‍රකාශ ද ඇතුළත් වේ. සංශෝධනයක්, අඛණ්ඩතාව පිළිබඳ ප්‍රකාශයක්, අවසන් කිරීමේ ප්‍රකාශයක් හෝ විශෝධන ප්‍රකාශයක් අදාළ වන්නේ යම් දැන්වීමකට ද, එම දැන්වීම "මූලික දැන්වීම" වේ;

"ජාතික හැඳුනුම්පත" යන්නෙන් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත අදහස් වේ;

"ලාභ" යන්නෙන් —

(i) සමපාර්ශ්වීය ද්‍රව්‍ය විකිණීමෙන්, බදු දීමෙන්, බලපත්‍ර දීමෙන්, හුවමාරු කිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමෙන් අත්පත් කරගන්නා කවර වූ හෝ දේ;

(ii) සමපාර්ශ්වීය ද්‍රව්‍ය මත රැස්කර ගන්නා ලද හෝ එම ද්‍රව්‍ය සම්බන්ධයෙන් බෙදාහරින ලද කවර වූ හෝ දේ;

(iii) සමපාර්ශ්වීය ද්‍රව්‍යවලින් පැන නගින්නා වූ අයිතිවාසිකම්;

(iv) සමපාර්ශ්වීය ද්‍රව්‍ය නැතිවීමෙන්, විකිණීම ස්ථිර නොකිරීමෙන්, ඒවායේ දෝෂ තිබීමෙන් හා ඒවාට හානි සිදුවීමේ හේතුවෙන්, සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ වටිනාකමේ ප්‍රමාණයට අනුව පැන නගින්නා වූ මුදල් ඉල්ලීම්, සහ

(v) සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ වටිනාකමෙහි ප්‍රමාණයට සහ ණයකරුට හෝ සුරක්ෂිතලත් පාර්ශ්වයට ගෙවිය යුතු ප්‍රමාණයට, සමපාර්ශ්වීය ද්‍රව්‍ය නැති වීමෙන්, විකිණීම ස්ථිර නොකිරීමෙන්, ඒවායේ දෝෂ තිබීමෙන් හා ඒවාට හානි සිදුවීමේ හේතුවෙන් ලැබිය යුතු රක්ෂණ මුදල්,

අදහස් වේ;

"සුරක්ෂිතලත් පාර්ශ්වය" යන්නෙන් ගිණුම් හෝ පුද්ගලික දේපළ පත්‍රයක් විකුණනු ලැබූ තැනැත්තකු සහ භාණ්ඩවල බදු දීමනාකරුවකු ද ඇතුළුව, සුරකු ගිවිසුමක් යටතේ සුරකු බැඳියාවක් ඇති කරන ලද්දේ යම් ණය දීමනාකරුවකු, විකුණුම්කරුවකු හෝ වෙනත් තැනැත්තකුගේ වාසිය සඳහා ද, එම ණය දීමනාකරු, විකුනුම්කරු හෝ වෙනත් තැනැත්තා අදහස් වේ;

"සුරක්ෂිතලත් ගනුදෙනුව" යන්නෙන් මේ පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් යම් ගනුදෙනුවක් අදහස් වේ;

"වටිනාකම" යන්නෙන්, යම් තැනැත්තකු —

(i) ණය ලබා ගෙන ඇති හෝ නොමැති වුවද, ණය දීම සඳහා වන බැඳීමක් ඇති කරන පොරොන්දුවක් වෙනුවෙන් අයිතිවාසිකම් අත් කර ගනු ලබන අවස්ථාවක; හෝ

(ii) කලින් පැවතියා වූ ඉල්ලීමකට ඇපයක් වශයෙන් හෝ එවැනි ඉල්ලීමක් සපුරාලීමක් ලෙස සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් අයිතිවාසිකම් අත්කරගනු ලබන අවස්ථාවක; හෝ

(iii) මිල දී ගැනීම සඳහා කලින් පැවතියා වූ කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් භාර දෙනු ලබන භාණ්ඩ භාර ගැනීමෙන්, අයිතිවාසිකම් අත් කරගනු ලබන අවස්ථාවක; හෝ

(iv) පොරොන්දුවක් සඳහා හුවමාරු කිරීමක් වශයෙන් දෙන ලද යමක් වෙනුවෙන් අයිතිවාසිකම් අත්කරගනු ලබන අවස්ථාවක,

එකී තැනැත්තා විසින් දෙනු ලබන වටිනාකම අදහස් වේ.

## 2009 අංක 55 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 30 වන දින]

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 55 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්ති ඇතුළත් කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම වගන්ති, එකී පනතේ 2අ, 2ආ, 2ඇ සහ 2ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"වලංගු කිරීම

2අ. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ අනුමත අර්ථසාධක අරමුදලට 996 පෙබරවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් අවසන් වනකාලය ඇතුළත සේවා යෝජකයකු හෝ සේවා නියුක්තයකු විසින් දායක මුදල් ගෙවා ඇති අවස්ථාවක එම දායක මුදල් වලංගු ලෙස අඩු කරගෙන ඇති බවට හෝ වලංගු ලෙස අරමුදලට දායක වී හෝ ගෙවා ඇති බවට සලකනු ලැබිය යුතු ය.

වඩාත් ඵලදායී අධි විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා අනුමැතිය

2ආ. (1) යෝජිත විශ්‍රාම වැටුප් අරමුදල හෝ යෝජනා ක්‍රමය මගින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියම කර ඇති නියමයන් සපුරාලන බවට කම්කරු කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදලට වඩා වාසිදායක වන්නා වූ සේවා යෝජකයා සහ සේවා නියුක්තයන් අතර, එකඟ විය හැකි විශ්‍රාම වැටුප් අරමුදලකින් හෝ යෝජනා ක්‍රමයකින් අධි ප්‍රතිලාභ ලැබීමට (මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී හෝ එදිනට පසුව යම් ආවරණ සේවා නියුක්තියක සේවකයකු වන යම් තැනැත්තකුට හිමිකම් ඇත්තේ ය. එවැනි අවස්ථාවක දී එම අරමුදල හෝ යෝජනා ක්‍රමය පිළිවෙලින් අනුමත දායක මුදල් ගෙවීමේ විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් බවට කම්කරු කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) අදාළ දිනයේ සිට බලපවත්වන පරිදි, අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් අනුමත දායක මුදල් ගෙවීමේ විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් බවට (1) වන උපවගන්තිය ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කරන අවස්ථාවක, එම අරමුදලට හෝ යෝජනා ක්‍රමයට ගෙවිය යුතු සහ ගෙවන ලද සියලු දායක මුදල් වලංගු ලෙස ගෙවා ඇති බවට සලකනු ලැබිය යුතු ය.

සැක දුරු කිරීම

2ඇ. (1) 1996 පෙබරවාරි මස 01 වන දිනට පසුව යම් කාලයක් ඇතුළත අධි විශ්‍රාමික ප්‍රතිලාභ ලබා දීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් නැතහොත් 2 අ වගන්තියේ සඳහන් කාලයට අදාළව යම් සේවා යෝජකයකු හෝ සේවා නියුක්තයකු සම්බන්ධයෙන් 2 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බවට සැක දුරු කිරීමේ සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(2) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හැර, වෙනත් විශ්‍රාම අර්ථසාධක අරමුදලකට, විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ වෙනත් යම් අධි විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට සේවා නියුක්තයකු සාමාජිකයකු වී හෝ දායක මුදල් ගෙවා ඇති අවස්ථාවක එම සාමාජිකත්වය සහ මුදල් ගෙවීම, අවස්ථාවෝචිත පරිදි එකී සේවා නියුක්තයා සාමාජිකයකු බවට පත් වූ දින සිට හෝ දායක මුදල් ගෙවූ දින සිට වලංගු ලෙස ගෙවා ඇති බවට සලකනු ලැබිය යුතු ය.

2ඇ. මේ පනත ක්‍රියාත්මක වන දින හා ඊට පසු දිනයේ සිට —

(අ) මේ පනත ආරම්භ වීමට පෙරාතුව 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල හැර යම් අනුමත අර්ථ සාධක අරමුදලකට, විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ වෙනත් යම් අධි විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා දායක මුදල් ගෙවා ඇති සේවා යෝජකයකු හෝ සේවා නියුක්තයකු සඳහා ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට අඛන්ඩව දායක මුදල් ගෙවීම සහ පවත්වාගෙන යාම; සහ

(ආ) මේ පනත ආරම්භ වීමෙන් පසු 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල හැර වෙනත් අනුමත අර්ථ සාධක අරමුදලකට හෝ වෙනත් යම් අධි විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට යම් සේවා යෝජකයකු හෝ සේවානියුක්තයකු දායක මුදල් ගෙවීම,

නීත්‍යානුකූල බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා තව දුරටත් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.''

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය ''මාස හයක් නොඉක්මවන හෝ රුපියල් දහසක දඩයක් නොඉක්මවන'' යන වචන වෙනුවට ''මාස දොළහක් නොඉක්මවන හෝ රුපියල් දස දහසක දඩයක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.''.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.